2022 මාර්තු
03 කාණ්ඩය 09 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට





## ලොවක් මවන්නී, ලොවක් රකින්නී....

කඳුලු නෙත දරා,
අඳුරු මුල්ලක ඉඳන් හිනා මවද්දී....
ඔබට හිමිනොවන දෑ කඳු ගණන් වෙද්දී....
කයට, සිතට පහර පිට පහර වැදෙද්දී....
ගැහැණුනි..
පීඩනය අත දරා සිටින සොයුරියනි,
ඇත ඔබට ශක්තිය!
ගත යුතුය යුක්තිය!
සටන් කළ යුතුව ඇත,
අඳුරු මුල්ලෙන් නැගිට!
නිදහසේ වෙසෙන්නට...
අභියෝග දිනන්නට...
ආදරය ලබන්නට...
ඇගේ ලොව හදන,
අවි තනන බිම මෙතන!

# මලකින් උපන්, විප්ලවයේ පළමු වෙඩි උණ්ඩය සිලියා සාන්චේස්



ඇය සියෙරා මාස්ට්‍රාහි පළමු ගරිල්ලා සෙබළියයි. බැටිස්ටාට එරෙහි සටනේ ජූලි 26 ව්‍යාපාරයේ නිර්මාතෘවරිය ඇයයි. මලක් තුළ සඟවා රහසේ පණිවිඩ හුවමාරු කළ රහස් පණිවිඩකාරිය ඇයයි. ඒ කියුබානු විප්ලවවාදිනියක, දේශපාලනඥවරියක, පර්යේෂකවරියක සහ ලේඛිකාවක වූ Celia Sánchez Manduleyයි.

ඇය උපත ලබන්නේ 1920 මැයි 9 දින කියුබාවේ ඔරියන්ට්හි මීඩියා ලූනාහි වන අතර හැදී වැඩෙන්නේ කියුබාවේ පිලෝන්හිදීය. ඇගේ පියා වෛද්‍ය මැනුවෙල් සැන්චෙස් වූ අතර මව ඈ කුඩාකලදීම මිය ගියාය. වයස අවුරුදු හයේ සිට ස්නායු ආබාධයකින් පෙලුණු සාන්චේස් සිය පාසල් ජීවිතයෙන් පසුව සිය පියා සමඟ ඔහුගේ වෛද්‍ය කටයුතුවලට සම්බන්ධ විය. කිසිදා විශ්වවිද්‍යාලයකට නොගියද සාන්චේස් දැනුමෙන් අතිශය පොහොසත් විය. ෆිදෙල් කැස්ත්‍රෝ සමඟ කියුබානු විප්ලවය කෙරෙහි අවධානය යොමු කිරීමට පටන්ගන්නා තෙක්ම ඇය ඇගේ පියාගේ වෛද්‍ය කටයුතුවලට නොකඩවා උදව් කළාය.

ඇගේ විප්ලවකාරී ගමන ඇරඹෙන්නේ 1952 මාර්තු 10 කුමන්ත්‍රණයෙන් පසුව බැටිස්ටා රජයට එරෙහි අරගලයට සම්බන්ධ වීමත් සමඟය. මුලදී ඇය ආයුධ ධාවකයෙකු ලෙස සිය ගමන ඇරඹූ නමුත් පසුව කියුබානු විප්ලවයේ සටන්කාමියෙකු ලෙස කටයුතු කිරීමට පටන් ගත්තාය. විප්ලවයේදී ආයුධයකින් වෙඩි තැබූ පළමු කාන්තාව වූ බැවින් ඇය 'සියෙරා මාස්ට්‍රාහි පළමු ගරිල්ලා සෙබළිය' ලෙස සැලකේ. ව්‍යාපාරය තුළ වෙහෙස මහන්සි වී වැඩ කිරීමත් සමඟ ගරිල්ලා කණ්ඩායමට බැඳුණු පළමු කාන්තාව බවට පත් වූවාය. කැරලිකාර හමුදාවේ සාමාන්‍ය කාර්ය මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස ඇය චේ ගුවේරා සහ අනෙකුත් කැරලිකරුවන්ට ආයුධ, ආහාර සහ වෛද්‍ය සැපයුම් සැපයුවාය. ෆ්‍රෑන්ක් පයිස් සමඟ එක්ව, විප්ලවය අතරතුර සටන් කණ්ඩායමක් එක්රැස් කළ පළමු කාන්තාවන්ගෙන් කෙනෙකි. Granma ගොඩබෑම සඳහා කියුබාවේ නිරිතදිග වෙරළ කලාපය පුරා අවශ්‍ය විධිවිධාන සලසා දුන් අතර, විප්ලවවාදීන් ගොඩ බැසීමෙන් පසු ශක්තිමත් කිරීමේ, සංවිධානය කිරීමේ වගකීමද ඇය සතු විය.

විප්ලවයෙන් අනතුරුව, 1960 ගණන්වල මැද සිට අග දක්වා කාලය තුළ, 1958 සිට කැස්ත්‍රෝගේ වෛද්‍යවරයා වූ රෙනේ වැලෙජෝ සහ සාන්චෙස් කියුබානු නායකයා-ෆිදෙල් කැස්ත්‍රෝගේ සමීපතම සගයන් දෙදෙනා බවට පත්විය. සාන්චේස්ට අමාත්‍ය මණ්ඩලයේ සභාපතිත්වයේ ලේකම් පදවිය පිරිනමන ලද අතර 1980 ජනවාරි 11දී පෙනහළු පිළිකාවෙන් මිය යන තුරුම ඈ රාජ්‍ය කවුන්සිලයේ සේවා දෙපාර්තමේන්තුවේ සේවය කළාය.

අද වන විට කියුබාවේ සිට සිම්බාබ්වේ දක්වා පාසල්, රෝහල් සහ විවිධ ප්‍රජා මධ්‍යස්ථානවල ඇගේ නම තැබීමෙන් කියුබානුවෝ ඇගේ ජීවිතය සිහිපත් කරති. විප්ලවයේ ඇගේ තීරණාත්මක භූමිකාව සිහිපත් කරති. Manzanilloහි මිනිසුන් Caridad del Cobra Virginගේ පූජාසනය සිලියා සාන්චේස් කියුබානු විප්ලවයට කළ කැපවීම සංකේතවත් කරන විවාහ පූජාසනයක් ලෙස භාවිතා කරයි. ඇගේ මරණයෙන් වසර 10කට පසුව ඇගේ රුව ඇඹූ පෙසෝ කාසියක්ද නිකුත් කළ අතර කියුබානු මුදල් නෝට්ටු වර්ග කිහිපයකද ඇයගේ රුව දිය සළකුණක් ලෙස භාවිතා කරයි.

සිලියා සාන්චේස් කියුබාවේ කාන්තාව සඳහා නව මානයක් විවර කළේ කාන්තාවක සතු විභවය මොනවට පෙන්වමිනි. නායකත්වය, රැකවරණය සහ නොපසුබස්නා වීර්යය, සරල බව, නිහතමානී බව, පරාර්ථකාමී බව විදාහල ඈ නියෝජනය කරන්නේ කියුබාවේ නව කාන්තාවගේ ප්‍රතිමූර්තියයි. විප්ලවය ඉදිරියේ සිලියා සාන්චේස් සතු වූ ශක්තිය, කායික ශ්‍රමය, සහ නායකත්වය ඉදිරියේ ස්ත්‍රීත්වය යනු හුදෙක් විද්‍යාත්මක කරුණක් පමණක් බව ඈ මුලු ලොවටම හෙළි කළාය.

# සමාජය ප්‍රතිසංවිධානය කිරීම අත්‍යාවශ්‍යයි...



*ජවිපෙ ජාතික සංවිධායක*
*බිමල් රත්නායක*
*සහෝදරයා සමග කළ සංවාදය ඇසුරෙනි...*

**රටේ පවතින දේශපාලන උණුසුමට සාපේක්ෂව ඒ සඳහා කාන්තාවගේ දායකත්වය පිළිබඳව සතුටු විය හැකිද?**

මං හිතන්නෙ සමාජවාදී තරුණ සංගමය මඟින් මේ දිනවල කරන "ජේ.වී.පී. යුත් එකට සෙට් වෙන්න" කියන වැඩසටහන දිහා බැලුවත් තරුණියන්ගේ දේශපාලන සහභාගීත්වයේ වර්ධනයක් දකින්න තියෙනවා. සෝෂල් මීඩියා තුළ විතරක් නෙවෙයි, ගම් මට්ටමේ කරන ප්‍රාදේශීය සාකච්ඡාවලදිත්, විදේශගත ශ්‍රමික ප්‍රජාව අතරත් මෙය පෙනෙන්නට තිබෙනවා. ඒ වගේම මට හිතෙනවා, ලංකාවේ පහුගිය කාලය තුළ ගෙනගිය ගුරු අරගලය මඟින් කාන්තාවන් කෙරෙහි දේශපාලන පන්නරයක් ලබා දීමට යම් සාධනීය දායකත්වයක් ලැබුණා කියලා.

අනෙක් විශේෂම කාරණය තමයි අද රටේ උද්ගත වෙලා තියෙන විශාල ආර්ථික අර්බුදය හේතුවෙනුත්, ඒ නිසාම පැන නැඟිලා තියෙන අනාගතය පිළිබඳ අවිශ්වාසය විසිනුත් කාටත් තේරුම් යමින් තිබෙනවා මේ සඳහා දේශපාලන විසඳුමක් අත්‍යාවශ්‍යය බව. ඒ නිසා අනාගතයක් නැති රටක ජීවත්වීමට සිද්ධ වීමේ බිය විසිනුත් කාන්තාවන්ව වැඩි වැඩියෙන් දේශපාලනය කෙරෙහි නැඹුරු කරවා තිබෙනවා. ඉතින් පොදුවේ ගත්තොත් කාන්තාවන්ගේ දේශපාලන සංවේදීභාවයේ, කතාබහේ සහ ක්‍රියාකාරීත්වයේ යම් සාධනීය වැඩිවීමක් පෙන්නුම් කරලා තියෙන බව පැහැදිලියි.

**කාන්තාව සමාජය තුළ ඉදිරියට රැගෙන ඒම සඳහා 25% කාන්තා නියෝජනය ආදී නීති පැනවීම පමණක් ප්‍රමාණවත්ද?**

මෙහෙමයි... නීති පනවලා විතරක් බැහැ තමයි. මොකද නීති කියලා කියන්නේ හැමවිටම පවතින රාමුව රකිමින් තියෙන දෙයක්නේ. එතකොට ඒක සීමාසහිතයි. නමුත් කාන්තාවන්ට ඡන්ද අයිතිය ලබාදීම, ගැහැණු දරුවන් අනිවාර්යයෙන් පාසල් යැවීම, අවුරුදු 18ට අඩුනම් ඔවුන්ව බලහත්කාරයෙන් විවාහ කර නොදිය යුතු බව ආදී කාන්තාව සමාන පුරවැසියෙක් ලෙස පිළිගැනීමෙහිලා වැදගත් ප්‍රගතිශීලී කරුණු රාශියක් සමාජය තුළ යථාර්ථයක් බවට පත්කරවන්නත් සමහර නීතිවලින් විශාල පිටිවහලක් ලැබුණා.

ඕනෑම පුරවැසියෙකුට වෘත්තීමය ජීවිතයක්, පෞද්ගලික ජීවිතයක් සහ සමාජ ජීවිතයක් තිබිය යුතුයි. නමුත් අද වන විට මේ ක්‍රමය තුළ ගැහැණියට ඇගේ සමාජ ජීවිතය විශාල වශයෙන් අහිමිව යන බවක් පෙනෙනවා. ගමේ මළගෙදරකට යන්න, යාළුවෙක් ආශ්‍රය කරන්න, සමිති සමාගම්වල වැඩකරන්න ඇයට ලැබෙන ඉඩ බොහොම සීමිතයි.

ඒ වගේම ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් අතරින් සියයට හැත්තෑවක්ම පමණ ඉන්නෙත් තරුණියන්. එහෙම උගත් ප්‍රජාවක් ඉඳලත් කාන්තාවන්ගේ වෘත්තීමය ජීවිතය පැත්තෙන් ගත්තොත් එහිදී අපට පෙනෙන දේ තමයි රැකියාවේ ඉහළට යන කාන්තාවන්ගේ ප්‍රතිශතය රැකියාවේ නියුතු කාන්තාවන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව සීමාසහිත වීම. අපේ රටවල විතරක් නෙවෙයි, ගොඩක් දියුණු ධනපති රටවල පවා කාන්තාවන්ට බොහෝ ගැටලු තිබෙනවා. කලින් විශ්‍රාම යන්න, ගෙදරදොරේ වැඩවලින් වැඩි ප්‍රමාණයක් ඉටු කරන්න වගේම තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් තමන්ගේ වෘත්තීය ජීවිතය කැප කරන්න සිද්ධ වෙනවා. ඇයට අවසානයේ දී වෘත්තීය ජීවිතේ ඉහළට ගියොත් පවුල් ජීවිතය අතඅරින්නත්, පවුල් ජීවිතය හරියට ගෙනියන්නම් වෘත්තීය ජීවිතය කැපකරන්නත් සිද්ධ වෙලා. ඒ නිසා සමාන පුරවැසියෙක් ලෙස ගැහැණියට තමන්ගේ ජීවිතය ගතකළ හැකි වන පරිදි සමාජය ප්‍රතිසංවිධානය කරන්න ඕන.

**හැම සාර්ථක පිරිමියෙක් පිටිපස්සෙම ගැහැණියක් ඉන්නවා කියලා කතාවක් තියෙනවනේ. ලෝක ඉතිහාසයත් එක්ක බලනකොට සාර්ථක ගැහැණු ගැන මොකද හිතෙන්නෙ?**

ඇත්තටම ගත්තොත් ඔය කියමන හරහා කියවෙන්නෙත් පිරිමියාගේ වෘත්තීමය ජීවිතය සාර්ථක කරවීම වෙනුවෙන් ගැහැණිය සම්පූර්ණයෙන්ම පිරිමියාගේ පෞද්ගලික ජීවිතයේ වගකීමුත්, සමහර වෙලාවට ඔහුගේ සමාජ ජීවිතයේ වගකීමුත් ඉටුකරනවා කියන කාරණයනේ. මොකද එතකොට තමයි පිරිමියාට තමන්ගේ වෘත්තීමය ජීවිතය පිළිබඳ තනි ඉලක්කයකට යන්න පුළුවන්කම තියෙන්නේ. ඇත්තටම ගත්තොත් මේ වගේ කියමන් විසින් කාන්තාවගේ හිස මත ඔටුනු පළන්දනවයි කියලා හිතුවට ඒවා ඇත්තටම කටු ඔටුනු.

ඒ වගේම ලෝක ඉතිහාසය ඇතුළෙ අපට හමුවන විවිධ කාන්තා චරිත දිහා හොඳින් බැලුවොත් අපට පෙනෙන දේ තමයි ඒ අතරිනුත් සාතිශය බහුතරයක් දෙනා වරප්‍රසාදිත පවුල්වල අය කියන කාරණය. ඒ බොහෝ අය තමන්ගේ වංශවත්කමේ හයියත් අරන් හැබැයි සමාජය තුළ ගැහැණියට තිබුණු බාධාවලට එරෙහිව හැප්පුණු අයයි. තවත් කොටසක් ඉන්නවා ඒ අයට තමන්ගේ ස්වාමි පුරුෂයා, පියා හෝ සහෝදරයින් විසින් උදව් කරපු. ඉතිහාසයේ සමහර කාල තිබුණා කාන්තාවන්ට පොත් ලියන්න තහනම් කරපු. ඒ නිසා කාන්තාවන් ලියපු සමහර විද්‍යා සහ වෛද්‍ය නිබන්දන පළකරලා තියෙන්නේ ඒ අයට සමීප පිරිමියෙකුගෙ නමින්.

ඒ වගේම කම්කරු පංති සටන් සහ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සටන්වල ඉතිහාසය ගත්තොත් ගැහැණු පිරිමි කවුරුත් එකයි, සමාන පුරවැසියන්ය කියන සංවාදය ගොඩක්ම මතු වෙන්නේ 1800න් පස්සෙ. ඒ නිසා 1900න් පස්සේ තමයි ඇත්තටම වැඩකරන පංතියේ කාන්තාවෝ ඔය කියන අභියෝග බාධා බිඳගෙන ඉස්සරහට එන්නේ. එයාලා ගත්තොත් බොහෝ අවස්ථාවලදී තමන්ගෙ ගෘහමය කටයුතුත් කරගෙන, ආර්ථික දුෂ්කරතා හා සමාජයේ හෑල්ලුවට ලක්කිරීම් ආදියත් දරාගෙන තමයි ඉදිරියට ආවෙ.

**එහෙම නම් කාන්තාවට විමුක්තිය උදාකරලීම සඳහා මොකක්ද තිබෙන විසඳුම?**

කෙටියෙන්ම කියනවා නම් කාන්තාවට ඇයගේ සමාජමය භූමිකාවත්, වෘත්තීමය හා ගෘහමය භූමිකාවත් එකිනෙක පෝෂණය කරමින් කළ හැකි සමාජයක් නිර්මාණය කිරීමෙන්ම පමණයි එය කළ හැක්කේ. නමුත් ඒක තනි තනිව කරගත හැකි දෙයක් නෙවෙයි. උදාහරණයක් විදියට කාන්තාවට තමන්ගේ දරුවා තබා යා හැකි උසස් මට්ටමේ ළමා සුරැකුම් මධ්‍යස්ථානයක් තියෙනවනම් තමයි ඇයට නිදහසේ තමන්ගෙ ශ්‍රම ජීවිතය වෙනුවෙන් කැපවෙන්න පුළුවන්කම තියෙන්නේ. ඇත්තටම ගත්තොත් ලෝකයට දිවා සුරැකුම් මධ්‍යස්ථාන හඳුන්වා දුන්නේ ඔය අරමුණින් වුණත් ධනවාදය ඒක යොදාගන්නේ ලාබ උපයන ව්‍යාපාරයක් විදියටයි. මොකද අප ජීවත් වන මේ සමාජ ක්‍රමය නිර්මාණය කරලා තියෙන්නේ ලාබය උපයන්න මිසක් කාන්තාවට හෝ සමාජයට විමුක්තිය උදා කරන්න නෙවෙයිනේ.

ඒ නිසා ඇත්තටම ගත්තොත් සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහනය ආදී සියලු දේ පෙළගැස්විය යුත්තේ මහජනතාවගේ සහ සමාජයේ ප්‍රගමනය උදෙසායි. එය කළ හැක්කේ සමාජවාදයටයි.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# තෙල් පෝලිමේ අයගේ ගෑස්කට් යෑමට පෙර...

මේ වෙලාවේ මුළු සමාජයම ඇට් කෙහෙල් කාපු උගුඩුවෝ වගේ වෙලා ඉන්නේ. උගුඩුවා ඇට්කෙහෙල් කන්නෙ නම් පට්ට ෆන් එකේ. හැබැයි දිරවලා මළපහ කරද්දි උගේ ජීවිතේම බිඳවැටෙන මට්ටමේ දුකක් වේදනාවක් විඳිනවා.

ඉන්න හිතෙන රටක් හදාගන්න බලාපොරොත්තුව ජීවිතේ තෙරපෙමින්, දුක් අඳෝනා මැද ජීවිතය ගෙවන මිනිස්සුත් ඒ වගේ. ඒ උවමනාව ඇට් කෙහෙල් ගෙඩියක් වෙලා ආසාවෙන් කාලා දිරවගන්න බැරුව වේදනා විඳින්න වෙනවා නම් ඒ කාපු ඇට් කෙහෙල් ගෙඩිය ගැන අපි අලුතෙන් සිතිය යුතුයි නේද?

ගෑස් පෝලිමේ දත්කූරු කෑවට, කඳුලු සලමින් වේදනා පිට කරාට, මරාගෙන මැරෙන්න කතා කරාට, ගෑස් පෝලිම අඩු වුණු ගමන් ඒවා මතක වෙලා ගියා මතකද? පොහොර පෝලිම්වලදි වැටවල් කඩන් පනින්න කතා කළාට, ඇමතිලාව පුච්චන්න කතා කළාට පොහොර ලැබුණෙ නැති උනත් පොහොර ගහන්න ඕන කාලෙ පහුවුනාම ඒ වේදනාව දරාගෙන පැත්තකට වුණා නේද? තෙල් පෝලිම කිලෝමීටර ගණන් දිග උනාට, රට හදන විරුවා සින්දු දාගෙන නැටුවාට, පිරවුම්හලේ හිමිකරු සමඟ තෙල්වලට ආරවුල් ඇති කරගත්තට, පෝලිමේ ඉන්න මිනිස්සුම ඇනකොටා ගත්තට මේ තෙල් පෝලිම් ඉවර වුණොත් ඔබ ආයෙමත් නිෂ්ක්‍රීය වෙනවාද?

ඔබට විශ්වාසද හෙට බෙහෙත් පෝලිමක් නොවේවි කියා? ඔබට විශ්වාසද හෙට නැවතත් ඉහත අර්බුද යලි ඇති නොවේවි කියා? ඔබට විශ්වාසද එකවුන්ට් එකේ සල්ලි තිබුණට ජීවත්වෙන්න පුළුවන් සමාජයක් ඉතුරු වෙයි කියලා?


ඇට් කෙහෙල් කාපු උගුඩුවා අමාරුවෙන් මළපහ කරාට ඒ වේදනාව ආයෙත් අමතක කරලා දාලා ආයෙ ආයෙ ඇට් කෙහෙල් ගෙඩි දැක්කම කන්න හිතෙනවා වගේ, අර්බුදයක් ළඟට ආවම තමන්ගෙ පීඩාව පිටකරලා ආපහු මොකුත් නෑ කියලා හිතලා සැනසීමේ ඉන්න හිතන මේ අපේ පුරුද්ද වෙනස් කළ යුතු නැද්ද?

මුළු රටේම ආර්ථිකය බිඳ වැටිලා, භාණ්ඩ හිඟවෙලා, මිනිසුන්ගේ ජීවිත අවුල් වෙලා, අනාගතය ගැන බලාපොරොත්තු සුන්වෙලා, අපේක්ෂාභංගත්වයට පත්වෙලා ඉන්න දුෂ්කර මොහොතක එහෙනම් අපි කුමක් කළ යුතුද? ඔව්, වැඩේ තියෙන්නෙ අපෙ අතේ!

ඇට්කෙහෙල් කන උගුඩුවන් වගේ නොවී, අපේ අනාගතය වෙනුවෙන් මේ රට වෙනස් කරන්න, ඒ වෙනුවෙන් පෙරමුණ ගන්න, නැවත නැවතත් ඇට්කෙහෙල්වලට නොරැවටෙන ප්‍රජාවක් විදියට පෙබරවාරි 26 තංගල්ලෙන් පටන් ගත්තා වගේ නොවෙනස්ව, රටම පරිවර්තනය කරන තෙක් අපි එකතුවෙලා මේ ගේම ගහමු!.

**මාර්තු 03**

## අලුත් බල්ලෙක් අවශ්‍ය කර තිබේ....



බල්ලා මැරෙන්න යන බව දැනගත්තම මැක්කෝ පැනලා යනවා කියලා කතාවක් තියනවනේ. ඔය කතාවට මේ දවස්වල බුකියට වටිනාකමක් ඇවිල්ලා. පසුගියදා ආණ්ඩුවෙන් විමල් සහ ගම්මන්පිල අමාත්‍ය ධුරවලින් ඉවත්කරා. මේකට ආසන්න හේතුව වුනේ, ආණ්ඩුවේ පක්ෂ 11 එකතුවෙලා "මුළු රටම හරිමගට" යන සම්මන්ත්‍රණය පැවැත්වීමයි. නමුත් බුකියේ බොහෝ පිරිසකගේ කතාබහට ලක් වුනේ, මේක රාජපක්ෂලාගෙම නාඩගමක් බවයි. ආණ්ඩුව ගැන විශ්වාසය තැබූ ජනතාව දැන් දැන් ආණ්ඩුව අත්හැර ගොසින්. මේක ජනතාව විපක්ෂයට යෑම වැළැක්වීම සඳහා යෙදූ කපටි නාට්‍යයක් බවට බොහෝ කසුකුසු ඇතිවුණා. ඒ බව සනාථ වෙන්නේ වාසුදේව ඇමතුමා කළ ප්‍රකාශයත් එක්කයි. ඔහු කියන්නේ ආණ්ඩුව එපාවෙන ජනතාවට කිසිවිටකත් ජවිපෙට හා සජබට එක්නොවෙන ලෙසයි. මේ අය දැන් දන්නවා ආණ්ඩුව හත්පොලේ ගාගෙන ඉන්නේ කියලා. ආණ්ඩුවට විශාල විරෝධයක් මතුවෙලා. ඒ නිසා මේ අයගේ උපක්‍රමය ඊළඟ මහ මැතිවරණයට මන්ත්‍රීකම රැකගන්න කරන වෑයමක් වෙන්න පුලුවන් කියලයි බුකීවාසින් සැක කරන්නෙ. දැන් ඉතිං ජනතාව ඇහැ ගහගෙන ඉන්න ඕන. ගිනිපෙල්ලෙන් බැට කෑ එකා කලාමැදිරියටත් බයයි කියනවනේ.

**මාර්තු 08**

## 'වැඩකරන අපේ විරුවා' කිවුවොත් බලාගෙනයි!



මේ දිනවල රට නැවතත් පෝලිම් යුගයක!. තෙල් පොලින්, ගෑස් පෝලිම්, කිරිපිටි පෝලිම්, ඒ විතරක්ද? දැන් අලුත්ම එක අරක්කු පෝලිම්. රටේ ජනතාව දැඩි අපහසුතාවයකටත්, පීඩනයටත් ගෝඨාභය ආණ්ඩුව විසින් පත්කරලා. ඒ නිසාම ඒ විරෝධය පෝලිම් තුළින් මතුවෙන්න පටන්ගෙන. පහුගිය දවස්වල තරුණයින් අපූරු වැඩක් කරා. ගෝඨාබය රාජපක්ෂ මහතාගේ ජනාධිපතිවරණ තීම් සෝන්ග් එක, 'වැඩකරන අපේ විරුවා' සිංදුව පෝලිම්වල ඉන්න ගමන් කියන්න පටන් ගත්තා. සමහර අය ඡන්දය කාලේ මහින්ද රාජපක්ෂ මහතාගේ කතා දාන්න පටන්ගත්තා. ඒක රැල්ලක් විදියට ගියා. අපේ ජනාධිපතිතුමාට මළපැනලා කියලයි ආරංචි. ඒ නිසා මේ සිංදුව කියන අය සම්බන්ධව තොරතුරු හොයන්න CIDය විමර්ශන ආරම්භ කරලා කියලා බුකියේ තැන් තැන්වල පළවුණා. පොලිස් මාධ්‍ය ප්‍රකාශක නම් කියන්නේ එහෙම දෙයක් නෑ කියලයි. නමුත් එම සිදුවීම ඇත්ත නම් හිතන්න තියෙන්නේ, ආණ්ඩුව දැන් දැන් බයවී ඇති තරමත්, මේක රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය වගේම භාෂණයේ නිදහසටත් එල්ල කරන මරු පහරක් බව.

**මාර්තු 08**

## "ජනාධිපතිතුමෝ, අපි එනවා හම්බවෙන්න, ඒ ඔබතුමා ඉන්න වෙලාවක" සමන්මලී කියයි



මාර්තු 8 කාන්තා දිනය. කාන්තාවෝ මේ දිනයේදී විවිධ උත්සව පවත්වනවා. සමහරු මේ දිනයේ වැදගත්කම නොදන්නවා කියලයි ඔවුන් කරන දේවල් දිහා බැලුවම පේන්නේ. නමුත් අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය රටේ කාන්තාවන් මුහුණ දී ඇති ප්‍රශ්න කියන්න කොළඹට ආවා. පාගමනකින් ආරම්භ කළ පෙළපාලිය කොටුව දුම්රියපළෙන් අවසන් වුණා. එහිදී එම සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය මෙසේ අදහස් පළ කළා. "අද දරුවා පාසල් යන්න විදියක් නැතිව අඬ අඬ ගෙදර, තෙල් නැතිව බස් වැඩකරන්නෑ, කොළ නැතිව පොත් ටික අච්චු ගහන්න විදියක් නෑ, අපිට කියනවා පොත් නැත්නම් ගල්ලෑල්ලයි, ගල් කූරයි අරන් උගන්නන්නලු, අපිට කියන්නේ ගල්යුගයට යන්න කියලද? ජනාධිපතිගේ අපල දුරුවෙන්න ඥානා අක්කා මතුරලා දෙන බිත්තර විපක්ෂයටයි, ජනතාවටයි ගහන්න මැරයෝ එවනවා. ජනාධිපතිතුමෝ, අපි ඔබව හම්බෙන්න ළඟදිම එනවා, ඒ එන්නේ ඔබතුමා නැතිවෙලාවක නෙවෙයි, ඔබතුමා ඉන්න වෙලාවක, මොකටද එන්නේ? ඔබතුමාගේ ආණ්ඩුව ගෙදර යවන්න. අපේ ඇමතිතුමා කියනවා හෝම්ෂොප් කරන්න කියලා. අද ගෙවල් ඇතුලේ විදුලිය නැහැ, ගෑස්ටික නැහැ, කිරිපිටි නැහැ, බඩුමිල අහස උසට වැඩිවෙලා, ඉතිං කොහොමද හෝම්ෂොප් කරන්නේ. අපි අපේ වතුකරේ සහෝදරියන්ට කියනවා, කලාපයේ දුක්විඳින සහෝදරියන්ට කියනවා, ගෙවල් ඇතුලේ විශාල බර පොදියක් පටවගෙන දුක්විඳින අපේ සහෝදරියන්ට කියනවා, ඔබගේ ජීවිතය ලස්සන කරගන්න නම්, ඔබට හෙටක් හදාගන්න නම් මාරුවෙන් මාරුවට මේ දෙගොල්ලන්ට ඡන්දය දීලා හරියන්නේ නැහැ. මේ රට වෙනස්කරන්න අපි එකතුවෙලා අලුත් බලවේගයක් බලයට ගේන්න ඕන"

**මාර්තු 09**

## ජනාධිපති නෑ කිවුවට රටේම කපනවා

ජනතාවට වෙලා තියෙන්නේ ගහෙන් වැටුන මිනිහට ගොනා ඇන්නා වගේ වැඩක්. බඩුමිල අහස උසට, යාන්තම් වේලක් දෙවේලක් කාලා තමයි දවස ගෙවන්නේ. අමාරුවෙන් උපයාගත් දේත් උයාගන්න විදියක් නෑ ගෑස් නැතිව. පහුගිය කාලේ අමාරුවෙන් හරි විදුලියෙන් උය උයා හිටපු එකටත් දැන් කෙලවුණා කියලයි බුකීවාසින් චෝදනා කරන්නෙ. රටේ විදුලිය කපන්න පටන් අරගෙන. මිනිසුන්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම අඩපණවෙලා. කන්න බොන්න වගේම එදා වේල



හම්බකරගත් බිස්නස් එකට, නැත්නම් පුංචි කර්මාන්තයටත් හෙනහුරා ගහලා. ඒ විතරක්ද විභාග ලියන දරුවන්ට පාඩම් කරන්න වෙලා තියෙන්නේ කුප්පි ලාම්පුවෙන්. රට ඉස්සරහට යනවා කිවුවාට දැන් යන්නේ ගල්යුගයට බවයි බුකියේ ඇතැම් කෙල්ලෝ කොල්ලො කින්ඩි දාන්නේ. බලාගෙන ගියාම ඒකත් ඇත්ත කියලා හිතෙනවා. නමුත් මොකුත් නොදන්න රටේ ජනාධිපතිතුමා නම් කියන්නේ 05 වැනිදායින් පස්සේ විදුලිය කපන් නෑ කියලයි. නමුත් අද 9ය. බොහෝ ජනයා එතුමාගේ මව්පියෝ නම් සිහිකරනවා කියලා බුකියේ කමෙන්ට් දැක්කම පෙනී යනවා.

# "නිවස" කියන්නෙත් දේශපාලනික අවකාශයක්....

## ආචාර්ය කෞශල්‍යා ආරියරත්න



අපේ සමාජය හුරු වෙලා තියෙනවා හැමවෙලේම පොදු අවකාශය හා පෞද්ගලික අවකාශය කියලා සමාජය දෙකට බෙදන්න. න්‍යෂ්ටික පවුල, ගෙදර වැඩ, වැඩිහිටියන් බලාගන්න එක වගේ සුරැකුම් වැඩ ගැහැණිය මුල් වෙලා කරන්න ඕන, ඒක ඇගේ වගකීම කියලයි සමාජය හිතන්නෙ. දේශපාලනය වැනි පොදු අවකාශයේ වැඩ පිරිමින්ට අයිති වැඩ කියලා හිතනවා.

ඉතිං මේ මතය කඩන එක හරිම අභියෝගාත්මකයි. ගෘහය කියන වගකීමත් පොදු අවකාශයේ වැඩත් දෙදෙනාගේම වැඩ කියලා සමාජගත කරන්න වෙලා තියෙන්නෙත් අද ගැහැණු අයටමයි. ඒ බාධාව කඩාගෙන යන එක ඉතාම අභියෝගාත්මක වුණත් ඉතිහාසයේ ඒක කඩාගෙන ගිහිල්ලා තියෙන්නෙත් ගැහැණුම තමයි.

ඊළඟට පුරුෂ මූලික කතිකාවෙ තියෙන එකක් තමයි ගෙදර වැඩ දේශපාලනික වැඩ නෙමේ, ගෙදරින් එළියට ගිහින් කරන දේශපාලනික වැඩ ගැහැණු අයට කරන්න බැහැ කියන එක. මම හිතන්නෙ ස්ත්‍රිය කරන වැඩ වගේම ස්ත්‍රියක් වීමම දේශපාලනිකයි. ගෙදර කියලා කියන්නෙත් දේශපාලනික අවකාශයක් කියන එක එළියට ගේන එකත් ගැහැණියගෙ වගකීමක්.

# "කාන්තාව දුර්වල යැයි කීම අසත්‍යයක්"

## කතිකාචාර්ය අනූෂා සිවලිංගම්



කාන්තාව ගැන අපේ සමාජයේ මුල් බැසගෙන තියෙන සාම්ප්‍රදායික මතයක් තමයි ඇය දුර්වල බව මේ මතය ඇත්තටම නිර්මාණය කරපු එකක්. මං කතා කරන්නෙ සාමාජීය වශයෙන්. කුමන ලිංගිකත්වයක් තියෙන කෙනෙක් ගත්තත් සාපේක්ෂව දුර්වලතා සහ දක්ෂතා තියෙනවා. ගැහැණිය දුර්වලයි කියලා විද්‍යාත්මකව නෙමේ, සමාජීය වශයෙනුයි මතයක් ගොඩනගලා තියෙන්නෙ. ආරම්භයේ ඉඳලම මේ මතය ගොඩනගලා, තමන්ගේ ලාභයට පාවිච්චි කරන ලිංගික සත්වයන් තමයි ඉන්නෙ.

ආගමික සහ සංස්කෘතික පැත්තෙනුත් කාන්තාව දුර්වල කරලා තියෙනවා, කරමින් ඉන්නවා සහ අනාගතයේදිත් ඒක කරයි. මේ මතයට ගල් ගහන නිර්මාණ ඒ සංස්කෘතිය ඇතුළෙම බිහි වුණත් තාමත් ඒ ගෝත්‍රික මතය තමයි මුල් බැසගෙන තියෙන්නෙ.

අනික පුරුෂාධිපත්‍යය විසින් කාන්තාව දුර්වල තැනට තල්ලු කරලා තියෙන එක කොයිතරම්ද කියනවනම් කාන්තාවම පිළිගන්නවා ඇය දුර්වලයි කියලා. ලංකාවෙ විශේෂයෙන්ම දෙමළ කතා කරන සමාජයේ පුරුෂාධිපත්‍යය කොයිතරම් විශ්වාස කරනවද කියනවනම් විශේෂයෙන්ම හිංදු සමාජය ගත්තම පුරුෂයට වඩා ස්ත්‍රිය හිතනවා සමාජීය වශයෙන් තමන් දුර්වලයි කියලා.

කාන්තාව දුර්වලයි කියන සමාජ මතය සාධාරණීකරණය කරන්න හදනවනේ, විද්‍යාත්මක කරුණු ගෙනල්ලා. ඒ විද්‍යාවම කියනවා, කාන්තාව හැඟීම් අතින් පිරිමියාට වඩා බලවත් කියලා. ඒ වගේම කාන්තාව දුර්වලයි කියලා මතයක් ගොඩනගන ඉතිහාසයට ඇයි බැරිවුණේ ඇය හැඟීම්වලින් බලවත් කියලා මතයක් ගොඩනගන්නෙ?. කොහොම වුනත් මේ මතවාදවලින් වෙන්නෙ කාන්තාවගේ ආත්ම ශක්තිය නැති වෙන එකය. අපි අපේ ශක්තිය පෙන්වනකම් මේ මතය දිගටම තියෙයි.

# "ස්ත්‍රිය යනු මනුෂ්‍ය භාගයක් නොවෙයි...."

## *අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ගම්පහ දිස්ත්‍රික් සංවිධායිකා*
## චන්ද්‍රමාලි සහෝදරිය



ස්ත්‍රිය පීඩනයන්ට හා සියලුම සූරාකෑම්වලට එරෙහිව තම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ යුතුයි.  මන්ද, ඇයගේ විමුක්තිය දිනාගැනීමේ මාවත යෙදී ඇත්තේ පොදු සූරාකෑම අහෝසි කරන, නිෂ්පාදනයේ අයිතිය සැමට බෙදී යන සමාජයකදී පමණක් බැවිනුයි.

අපි අද ජීවත් වන මේ සමාජය තුළ  ගැහැණිය සහ පිරිමියා යන දෙදෙනාම පීඩාවට පත්වනවා. ස්ත්‍රිය යනු මනුෂ්‍ය භාගයක් නෙවෙයි. ඇය පූර්ණ මනුෂ්‍යයෙක්.

අද අපි ජීවත් වෙන සමාජය පුරුෂ මූලික, පුරුෂාධිපත්‍යය සහිත පීතෘමූලික සමාජයක් බව ඇත්ත. ඒ පුරුෂාධිපත්‍යය රකින්න දැන හෝ නොදැන ගැහැණු පිරිමි දෙගොල්ලොම දායක වෙනවා. අපේ සටන පුරුෂ විරෝධී සටනක් නෙවෙයි. ස්ත්‍රිය පීඩාවට පත් වන ඇත්ත මූලය අපි නිවැරදිව හඳුනාගත යුතුයි.

ඇය දෙවන පුරවැසියකු නොවේ.

ධනවාදය බිහිවීමත් සමඟ ස්ත්‍රිය ශ්‍රම වෙළඳපොළට කැඳවන ලද එහිදී සිදුවූයේ ස්ත්‍රියට රැකියා දීම නොව ඇයගේ ශ්‍රමය ඉතා අඩු මුදලට කොල්ල කෑමයි. එබැවින් කාන්තාවන් වන අපගේ සතුරා විය යුත්තේ පිරිමියා නොව ධනවාදයයි ධනවාදය තුළ කාන්තාව පමණක් නොව ළමයින් මහල්ලන් සහ පිරිමින් යන සියලු දෙනාම පීඩාවට පත් වී සිටිනවා. ඒ නිසා හුදෙකලා සටන් තුළින් කාන්තාවන්ට විමුක්තිය දිනාගත නොහැකි අතර විවිධ සංවිධානවලට බෙදී ස්ත්‍රීවාදය උත්තරාරෝපණය කරනවා වෙනුවට අප කළ යුත්තේ මුළුමහත් සමාජයම සූරාකෑම, පන්ති පීඩනය, සමාජ අසමානතාවයෙන් ගලවා ගැනීම සඳහා සමාජවාදය තෙක් සටන් කිරීමයි. එහිදී ස්ත්‍රියට පමණක් නොව මුළුමහත් සමාජයටම විමුක්තිය උදාකරගත හැකියි.

# සම්පත් කොල්ලයට බිලිවන ඌව වෙල්ලස්සේ ඉඩම්

වර්තමාන ධනේශ්වර පාලනය තම අවසන් කාර්තුව වේගවත්ව අවසන් කරමින් ඇත. එය ඔවුන් ගන්නා තීන්දු තීරණ හා ක්‍රියාමාර්ගවලින් මෙන්ම ජනතාවගේ ප්‍රතිචාරයන් තුළින්ද මනාව පිළිබිඹු වේ. 'යන යකා කොරහත් බිඳගෙනම යනවා' යැයි අපේ පැරණි ජනවහරේ කතාවක් තිබේ. ඒ අයුරින්ම පාලනයේ අවසන් කාර්තුව ගෙවන වත්මන් ධනපති පාලකයන් රටේ අනාගත පරම්පරාවන්ට උරුම අපේ රටේ වටිනා දේපළ හා සම්පත් විකිණීමද වේගවත් කර ඇත. ඌව වෙල්ලස්සේ ඉඩම් අක්කර 65000ක් සිංගප්පූරු සමාගමක් සතු කිරීමට යන්නේ එහි එක් පියවරක් ලෙසය.

ඌව වෙල්ලස්ස යනු අපට අපේ රටේ වීරයන් බිහිකළ ඓතිහාසික වටිනාකමක් සහිත බිමක්. එසේම ස්වභාවික සම්පත්වලින් අනූන සුවිශේෂී දේශගුණයක්ද සහිත භූමියකි. 1815 දී අපේ මුළු රටම ඉංග්‍රීසීන්ට නතු කිරීමෙන් පසු 1818 ඉංග්‍රීසීන්ට එරෙහි සටන ආරම්භ වන්නේ මේ ඌව වෙල්ලස්ස භූමියෙනි. මෙම සටනේදී ඉංග්‍රීසීහු මහා මිනිස් සංහාරයක් සිදුකළ අතර 'වෙල් ලක්ෂයක්' සහිත 'වෙල්ලස්සේ' වගා භූමිද ගිනිබත් කළහ. වැව්-අමුණු, ඇල-වේලි පුපුරවා හැරියහ. එම සටනින් ඉතිරි වූයේ කුඩා ළමුන් සහ කාන්තාවන් පමණි.

නමුත් වෙල්ලස්ස, ඒ අති බිහිසුණු මිනිස්-දේපළ සංහාරයට අභියෝග කරමින් යථා තත්වයට පත්වන්නේ ඒ ජනතාවගේම වෙහෙසිනි. ඉංග්‍රීසීන් විසින් විනාශ කරන ලද වැව්-අමුණු, ඇල-වේලි ටික හෝ ඉදිකර දීමට මෙතෙක් රට පාලනය කළ පාලකයින්ට නොහැකි විය. පාලකයින්ගේ එවැනි අවම මැදිහත්වීම් තුළ වුවද අදටත්, ගොවීහු තමන්ගේ වෙහෙසින් හා වර්ෂා ජලයේ පිහිටෙන් වී, බඩඉරිඟු, තල, කුරහන් මෙන්ම වට්ටක්කා වැනි එළවළු වගාවෙන්ද රටේ කෘෂිකර්මාන්තයට මොනවට දායක වෙති.

මෙසේ ගොවිජනයා විසින් දැනට වසර 30ක් පමණ තිස්සේ භුක්ති විඳින ලද වගාභූමි සහිත, එසේම රක්ෂිත හා අභයභූමිද ඇතුළත් මොණරාගල, බදුල්ල, අම්පාර යන දිස්ත්‍රික්ක තුනෙන් අක්කර 65000ක් බහු ජාතික සමාගමක් වූ සිංගප්පූරුවේ **Gazelle Ventures** සමාගමට පවරාදීමට කටයුතු කරන්නේ මහාපරිමාණ උක් වගාවක් වෙනුවෙනි. මේ නිසා, නිල්ගල ඔසු උයන ඇතුළත් රක්ෂිතය, ගල්ඔය වන රක්ෂිතය, මාදුරුඔය රක්ෂිතය ඇතුළු ප්‍රධාන රක්ෂිත ගණනාවක්ද, වනරක්ෂිත ප්‍රේරණ කලාප ඉඩම් මෙන්ම, ගොවි ජනතාව භුක්ති විඳින ඉඩම්ද, ආදිවාසීන් භුක්තිවිඳින ඉඩම්ද, පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ජාතික උරුමයන්ද සහිත වූ විශාල භූමි ප්‍රදේශයක්, ඉඩම් කොල්ලයට ගොදුරු වී තිබේ.

මෙම ඉඩම් කොල්ලය ආරම්භ වූයේ 2006 දෙසැම්බර් 06 දින මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මේ සඳහා කැබිනට් අනුමැතියක් ලබාගැනීමත් සමඟය. මේ සඳහා මහින්ද රාජපක්ෂ ගෙන්වූයේ බහුජාතික සමාගමක් වූ බ්‍රිතාන්‍යයේ බුකර්ට්‍රේට් සමාගමයි. නමුත් ඒ මොහොතේ එල්ලවූ දැඩි ජනතා විරෝධය හමුවේ බ්‍රිතාන්‍ය බුකර්ට්‍රේට් සමාගමට පලායාමට සිදුවිය. මෙය නැවත කරළියට එන්නේ 2017 දී හරින් ප්‍රනාන්දු, විජිත් විජිතමුණි සොයිසා වැනි එවකට රජයේ ප්‍රබල ඇමතිවරුන්ගේ මැදිහත් වීම මතය. එහිදී අංක **MDE/AD/03/CAB-PA/2017** දරණ කැබිනට් පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් වන්නේ බ්‍රිතාන්‍ය බුකර්ට්‍රේට් සමාගම වෙනුවට සිංගප්පූරු ගැසල් වෙන්චස් සමාගමට මෙම ඉඩම් ලබාදීමටය. මෙයත්, එල්ල වූ ජනතා විරෝධය හා ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ සංවිධානවල මැදිහත්වීම මත තාවකාලිකව හකුලා ගැනීමට පාලකයින්ට සිදුවිය.

වර්තමානය වන විට 'රටේ සම්පත් රැකගන්නවා' යැයි පාර්ම්බාමින් බලයට පැමිණි ගෝඨාභය රාජපක්ෂ පාලනයේ රැකවරණය යටතේ නැවතත්, සිංගප්පූරුවේ ගැසල් වෙන්චර්ස් **(Gazelle Ventures)** සමාගම හරහා එහි මව් සමාගම වන ඇමරිකාවේ නිව්යෝක් නුවර පිහිටි **CDVCA** නම් සමාගමට මෙම ඉඩම් ලබාදීමට කටයුතු සැලසුම් කර ඇත.

මෙලෙස ඌව වෙල්ලස්සේ ඉඩම් උක් වගාවක් වෙනුවෙන් ලබාදෙන්නේ සීනි නිෂ්පාදනය වෙනුවෙන් බවට පාර්ම්බාන පාලකයින්ට, දිරාපත් වෙමින් පවතින කන්තලේ සීනි කර්මාන්ත ශාලාව හා ඒ ආශ්‍රිත ඉඩම් නොපෙනෙන්නේ මන්ද? පැල්වත්ත හෝ හිඟුරාන සීනි කර්මාන්ත වැඩිදියුණු කිරීමට හෝ ඒවායේ නිෂ්පාදන ඉහළ නැංවීමට හෝ නුවණ පහළ නොවන්නේ මන්ද? ඒ, ඔවුන්ගේ ඇත්ත උවමනාව සීනි නිෂ්පාදනය කිරීම නොවන නිසාය. ඔවුන්ගේ ඇත්ත උවමනාව, කෙටිකාලීන අර්බුදයට තාවකාලික විසඳුම් සෙවීම පමණක්ය. ඒ වෙනුවෙන් අපේ අනාගතය සතු වටිනා දේපළ හා සම්පත් අලෙවි කිරීම පමණක්ය. ඒ අදූරදර්ශී උවමනාවේ ගොදුරක් බවට අද වෙල්ලස්සේ ඉඩම් පත්වෙමින් ඇත.

මෙසේ වෙල්ලස්සේ ඉඩම් අක්කර 65000ක් උක් වගාව වෙනුවෙන් යොදා ගතහොත්, ගොවීන්ගේ පාරම්පරික ගොවිතැන් කටයුතු විනාශ වී, උක් කර්මාන්තයේ කුලී සේවකයෙකු බවට පත්වීමට ඔවුන්ට සිදුවන්නේය. රක්ෂිත වනාන්තර එළිකිරීම නිසා බදුල්ල, මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්වල දැනටත් පවතින අලි-මිනිස් ගැටුම තව තවත් උග්‍ර වන්නේය. ආදිවාසී ජනයාගේ භූමි මෙන්ම නිල්ගල ඔසු උයන වැනි වටිනාකම් කියා නිමකළ නොහැකි අභයභූමි හා රක්ෂිතද විනාශ වී ගොස් මහාපරිමාණ පාරිසරික ගැටලු ගණනාවකට මුහුණ දීමට රටක් ලෙස අපට සිදුවන්නේය.

මේ නිසා සම්පත් කොල්ලයට ගොදුරු වී ඇති ඌව වෙල්ලස්සේ ඉඩම් රැක ගැනීම මෙන්ම ධනවාදයේ අවසන් කාර්තුව ඉතා වේගයෙන් අවසන් කරමින් සිටින මේ අදූරදර්ශී, විනාශකාරී පාලකයින්ගෙන් රට මුදවාගැනීමට මැදිහත් වීමද මේ මොහොතේ අප සතු වගකීමක් වන්නේය...!



# ඇගේ වේදනාවෙන් ඉදුණු බිරියානි



බිරියානි කියන්නේ කවුරුත් කන්න කැමති රස කෑමක්. දකුණු ඉන්දියාව බිරියානිවලට වඩාත් ප්‍රසිද්ධයි. මේ කියන්න යන්නේ දකුණු ඉන්දියානු මලයාලම් සිනමාවේ හැදුණු බිරියානි එකක් ගැන. රස වෙනුවට පපුව හූරන් යන වේදනාවක් හදට දනවන, ආසියානු පසුගාමී සමාජ සංස්කෘතිය ඇතුළෙ ගැහැණියකගේ, විශේෂයෙන්ම මුස්ලිම් සමාජය තුළ ගැහැණියකගේ ජීවිත යථාර්ථය මොනවට මුසු කළ චිත්‍රපටයක් ගැන. මේ බිරියානි!

"ලබන මාසේ තාත්තගෙ අනුස්මරණෙ. ගෙදරම උත්සවේ තියලා ගමේ හැමෝටම බිරියානි කන්න දෙමු!"

මුදු ගොස් පණපිටින් නොපැමිණි, එහෙත් පියා එනතුරු තවමත් උමතුවෙන් මඟ බලන් සිටින තම මව සමඟ එක්ව පියාගේ අනුස්මරණය සිදුකිරීම කදීජාගේ බලාපොරොත්තුවයි. නමුත් නොසිතූ මොහොතක සියල්ල කණපිට හැරවෙන්නේ ඇගේ සහෝදරයා ත්‍රස්තවාදී සංවිධානයකට සම්බන්ධව ඇති බවට ආරංචිවීමත් සමඟයි.

"ජමාත් වෙතින් දැනුම්දීමයි!. ඔබේ පව්ලේ සාමාජිකයෙක් වන ෂානාවාස්, කැරලි හා ත්‍රස්ත ක්‍රියා සම්බන්ධයෙන් අනුබල දෙන නිසා ඔබේ පවුල අප ප්‍රජාවෙන් නෙරපා දැමීමට කටයුතු කර ඇත!."

රෝමයේ 20වෙනි Asiatica සිනමා උළෙලේදී හොඳම චිත්‍රපටය සඳහා හෑඔජ්ක සම්මානයද, Banglore ජාත්‍යන්තර සිනමා උළෙල, Caleidoscope ඉන්දියානු සිනමා උළෙල ඇතුළු සිනමා උළෙලවල් ගණනාවකදි හොඳම චිත්‍රපටය, හොඳම නිළිය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් යටතේ සම්මාන රැසකින් පිදුම් ලැබූ බිරියානි චිත්‍රපටයේ පිටපත සහ අධ්‍යක්ෂණය සජින් බාබු විසින් වෙන අතර මෙහි නිෂ්පාදනය UAN Film House & Production ආයතනය විසිනි..

වැඩිවියට පත්වීමත් සමඟ පාසල් ගමන නවතා, අනෙක් මුස්ලිම් කාන්තාවන් සේම කදීජාටද විවාහයට පත්වීමට සිදුවිය. කාන්තාවක් වීම නිසාම, දරුවෙකු ලෙස ඇගේ අධ්‍යාපනය අයිතියද, තරුණියක ලෙස ඇයට හිමි නිදහසද, මිනිසෙකු ලෙස ඇයට හිමි ලිංගික තෘප්තියද අහිමිකරන ලද අතිශය අකාරුණික සමාජ සංස්කෘතිය විසින් බිරිඳක්, මවක් ලෙස ඇයට තම පවුල, තම කුසින් උපන් දරුවා සමඟ ජීවත්වීමද අහිමිකරයි.

"සතියක් ඇතුළත බිරිඳ එක්ක තියෙන හැම බැඳීමක්ම බිඳලා දාන්න. නැත්තන් පවුල විනාශවෙලා යනවා කියලායි මෑණියෝ කියන්නේ."

මෙකී සමාජීය අඳුර විසින් ගිලගෙන ඇත්තේ කාන්තාවන්ව පමණක්මද? නැත! ඉංජිනේරුවකු දක්වා අධ්‍යාපනය ලැබූ, ඉහළ පෙළේ රැකියාවක නියුතු වූ කදීජාගේ එකම සහෝදරයා, තමන්ට වඩා යහපත් ජීවිතයක් පෙනි පෙනී තිබියදීත් සියල්ල පසෙකලා තල්ලු වී ඇත්තේ, තල්ලු කර ඇත්තේ ජාතිකත්ව, ආගම් මත පදනම් වූ අන්තවාදයකටය.

"ෂානවාස් ඇතුළු මියගිය අයගේ සිරුරු භාරදීමට රජය කැමැත්ත පළකරයි."

මවගේ අසනීපය සුවකරනු වස් දේව බලැති යැයි විශ්වාස කෙරෙන පල්ලියක සෙවණ පතා ආ කදීජාට සිදුවන්නේ තම එකම සොයුරාගේ මරණයද බදා වැළඳගැනීමටය.

"ඇත්තම කිව්වොත් මෙහෙ වෙනතරමක් වෙන්නෙ ඉස්ලාම් ආගමට පටහැනි දේවල්. ඉස්ලාමය පිළිම වන්දනා කරන් නෑ. පල්ලියෙ හිටියා කියලා අම්මට හොඳ වෙන්නේ නෑ. ඒ නිසා හොඳ දොස්තර කෙනෙකුට පෙන්නන්න. මෙහෙ නැවතිලා ඉන්න ගොඩක් අය ඉන්නෙ කවුරුහරි දෙන දෙයක් කාලා පල්ලියෙම වැටිලා ඉන්න හිතාගෙන. මාත් මෙහෙට එන්න කලින් හුඟක් තැන්වල කරක් ගැහුවා."

අද කවා පොවා බලාගන්නා එළුවන් හෙට යාතිකා මැද, චාරිත්‍රානුකූලව මසට දක්කන සේම, පල්ලියේ වැටී දිවිගෙවන මේ ජීවිතත් හෙට කාගේ හෝ බිල්ලක් බව ඇයට වැටහෙන්නට දින දෙකක් ප්‍රමාණවත් විය. පල්ලියේ මුව්දීන්ගේ උදව් ඇතිව ඇගේ සහ මවගේ හිසට සෙවණක් ලැබෙන්නේ ඉන් පසුවය. නමුත් තම පුතාගේ අභාවය සැළවී එය දරාගත නොහී හද නැවතුණු ඇගේ මවද ඇයට අහිමිව යාමට වැඩි කලක් නොගියේය.

"ළඟ හිටපු අම්මාත් ගියා. මගෙ පුතාවවත් මට බලන්න නෑ. කාටවත්ම මොනවත් ඔප්පු කරන්න නැහැ. අම්මා වගේ වෙන්න ඕන නෑ මට. දිවිනහගන්නත් හයියක් නෑ."

"එතකොට ඔයා මොනවද කරන්න යන්නෙ?"

කදීජා සිය ජීවිතයට දෙවෙනි අවස්ථාවක් දෙනු ඇත. කඩේ මුදලාලිගේ ආශාවන්ට ඉඩදෙන්නේ බොහෝවිට අලුත් පවුල් ජීවිතයක අපේක්ෂාවෙන් විය යුතුය. නමුත් ඒ වෙනුවට එතැන සිදුවන්නේ ගණුදෙනුවක්ය. සමාජය ඇයව ඇද දමන්නේ ඇඟ විකිණීමේ මඟටය. පවුලක් දීමට එකඟ නොවන්නන් ඈ වෙනුවෙන් ගැණුම්කරුවන් සොයාදීමට ඉදිරිපත් වේ. නමුත් මේ අතර තවත් වරක් ඇය ඇගේ ජීවිතේට අවස්ථාවක් ලබාදීමට තීරණය කරයි. ඔව්, දැන් ඇයට පවුලක් තිබේ..

"අම්මටයි තාත්තටයි ෂානුටයි තුන්දෙනාටම එකට අනුස්මරණය දෙමු. ඒකට ආධාර සල්ලියි, මං රස්සාවෙන් හොයාගත්ත සල්ලියි දාමු.. මං වෙන රස්සාවක් හොයාගන්නත් ඕන.!"

දැන් ඇගේ අපේක්ෂාව යුතුකම් ඉටුකිරීමය. අහිමි වූ පවුල සිහිකර ගමට බිරියානි දානයක් දීමටය. මේ අපේක්ෂාව, සතුට ඇයට විඳීමට මේ සමාජය ඉඩ ලබාදේද?

අරාබිකරයෙන් වෙළඳාමත් සමඟ ආ බිරියානි රෙසිපිය එහි රසට අමතරව ආසියාතික සමාජෙට ගෙනා, පසුගාමී ධනවාදී සමාජ ක්‍රමය විසින් සිය ඇමට තබාගත්, වසර සිය ගණනක් ගෙවුණත් තවමත් ශේෂව පවතින බොහෝමයක් සංස්කෘතිකමය මළකුණු නිසා නීරස වුණ කාන්තා ජීවිතය, ඒ වේදනාත්මක ජීවිතය කෙසේ නම් අවසන් වේවිද?

සියල්ල අහිමිව, සිය ආත්මයද අහිමිව ගිය කදීජලාගේ සමාජ ප්‍රතිචාරය කෙසේ වේවිද? ජීවිතය තිබෙන තුරා ඈට අහිමි කළ අයිතීන්, සතුට, ඈ දරා සිටි අනේක විධ වේදනාවන්ම ඉදවා, ඇය සමාජයට සංග්‍රහ කරන්නේද වේදනාවකින්මය, බිරියානි එකකින්ය, කවමදාකවත් දිරවිය නොහැකි බිරියානි එකකින්ය...මලයාලම් සිනමාවේ බිහිවූ අග්‍රගණ්‍ය සිනමා වෘත්තයක් වන බිරියානි, දැන් ඔබට භාරයි!...

## සරදියෙල්ගේ කොලම

හිටන් එපා වෙච්ච අපේ හිපාටුවෝ ටික ඉල්ලුවේ පුටින්. හම්බුණේ හැමදේම හොඳටම කරන නන්දේ!.

නන්දේ පටන් ගත්තේ අත්සන් කරලා පෑන පෙට්ටියට දාලා. නන්දේ බැලුවා මේ රටේ මිනිස්සුන්ගේ කිසි පිළිවෙලක් නෑ. මාලු මාකට් එකට ගියත් පොරකනවා. එළවලු ගන්න ගියත් තදියමේ කෑ ගහනවා. තල්ලු කර ගන්නවා. නන්දෙට හොඳ අදහසක් ආවා. තෙල් නැව් වේලෙන්න ඇරියා....

ඒ අතරෙ මිනිහා ගියා යෝගට් හදන හැටි බලන්න. "ශා... මෙව්වා හදන්නේ රබර් කිරිවලින්ද?" මාධ්‍ය ඉස්සරහා නෑවා. සුපුරුදු පරිදි සිකියුරිටි එකෙන් මීඩියා මල්ලිලාගේ මෙමරි චිප් ටික එකතු කර ගත්තා.

පොර එතනින් එළියට බැහැලා එද්දී සෙඩ් ගාව ට්‍රැෆික්. වාහන පෝලිම් දිගටම. "බලන්න මං රටේ උන්ගේ විනය හදපු හැටි. බලන්නකෝ හරි ලස්සනට පෝලින් ගැහිලා ඉවසගෙන ඉන්න හැටි."

පොරට ආතල් එක වැඩි උනා. බැස්සා සෙඩ් එකක් ළඟ බිමට. මෙච්චරවෙලා පෝලිම්වල වේලි වේලි හිටපු සෙට් එක පොරව වට කර ගත්තා.

"කෝ සර් ඩීසල්?...."

"අපිට වැඩට යන්නත් නෑ... "

"උදේ ඉඳන් තාම පෝලිමේ....."

අයියලා ටික දැන් පොරගේ මූණටම ගේම ඉල්ලන ගාණට ඇවිල්ලා. එතන ගෝරනාඩු ගොඩයි.

"පොඩ්ඩක් ඉන්න, මෙච්චර කල් ඩීසල් දුන්නැද්ද? ගිය සතිවල තෙල් ගැහුවේ නැද්ද? තෙල් නැති වෙන්න විදියක් නෑනේ. පොඩ්ඩක් හොයලා බලන්න. මං තමයි හොඳටම කරලා තියෙන්නේ. ඈ, හෙ හෙ හෙ"

ආරක්ෂකයෝ දඩ බඩ ගාලා පොරව උස්සන් ආවා. ගත්තා පොරගේ ලොකු අයිය චා මල් රාජපස්සට. "අයියේ මේ ලොරිකාරයෝ තෙල් නෑ කියලා මගෙන් ගේම ඉල්ලනවනේ. මුන්ට දවස් දෙකක් තෙල් නැතුව ඉන්න බැරිද?"

"මෙහෙමනේ නන්දේ මල්ලි, දැන් තෙල් ලීටරයක් රුපියල් පනස් ගාණක්ද කොහෙද වෙනවනේ නේද?"

"අයියේ උඹට ඩිමෙන්ශියාද? මංම කී පාරක් වැඩි කළාද?"

"ආ දැන් ඊට වඩා වැඩිද? කමක් නෑ, තෙල් ලීටරයක් වාහන දෙකක් තියෙන පව්ලකට සතියකට ඇතිනේ?."

"ඔව්වා මට නිච්චි නෑ. අපි රජයෙන් ඇතිවෙන්න තෙල් ගහගන්නවනේ. කොහොමහරි මුං දැන් තෙල් නෑ කිය කිය ඉන්නවා. ඉවරවෙන්න කලින් අවුරුද්දකට විතර ඇතිවෙන්න එක සැරේ ගහගන්න එපැයි. අර ගීතා කෙල්ලත් ස්ටොක් කරන් තිබ්බේ."

"ඒක හරි. ඒක හරි. මටත් දැන් පොඩ්ඩකට කලින් කාලකන්නි චන්දදායකයෙක් කතා කරලා ඒ පැත්තෙ සෙඩ් 6න් 3 කම තෙල් නෑ කිව්වා."

"ඉතින් ඉතිරි දෙකේ බලලා නැද්ද? බලන්න එපැයි. ඒවායෙත් නැත්නම් එනකන් පෝලිමට වෙලා ඉන්න එකනේ තියෙන්නේ. ඔව්වා මහ ලොකු වැඩද? ඕන්නම් මට පුලුවන් හැම සෙඩ් එකක් ගාවම ජොගින් ට්‍රැක් දාලා දෙන්න."

නන්දෙට මළ පැනලා. ෆෝන් එක කට් කරලා ගත්තා ඇවන්ට්ගාඩ් ජංගිහොරාට.

"ඕයි තමුසේ මොනවද කරන්නේ. මිනිස්සු මට බනිනවා. කෝ තමුසෙගේ කුණු බිත්තරයො සෙට් එක? යවපන් උන්ව. ගහපන් ඔක්කොටම කුණු බිත්තර"

"යෙස් සර්, ගහන්නම් සර්!"

නූතන පරපුරේ සරදියෙල්



# ලෝක ජල දිනයට සීමා නොවෙන අධිෂ්ඨානයක්!

ජලය ජීවයේ උපතයි. අප පෘථිවි ගෝලය සෞරග්‍රහ මණ්ඩලයේ නීල වර්ණයෙන් පෙනෙන ග්‍රහලෝකයයි. මන්ද අප පෘථිවි ගෝලයෙන් 71% ක්ම වසා පැතිර ඇත්තේ ජලයයි. පෘථිවි ගෝලයේ ජීවය බිහිවීමට එය මහඟු උත්ප්‍රේරණයක් සැපයීය. මේ නිසා පෘථිවියේ ජීවයේ පැවැත්මට ජලය අනිවාර්ය, සදාකාලික සාධකයකි. එනිසා ලෝක ජල 'දිනයක්' නම් කිරීම පිටුපස ඇති ඛේදවාචකය කතා කළ යුතුමය.

පෘථිවි ගෝලයෙන් 71%ක් ජලය තිබුණා වුවද සාගරය භූතල ජලයෙන් 97%ක් දරන අතර, ග්ලැසියරයන් හා ධ්‍රැවීය අයිස් වැස්මන් 2.4% ක්ද, අනෙකුත් ගොඩබිම භූතල ජල ධාරකයන් වන ගංගාවන්, විල් හා පොකුණු තවත් 0.6% දරයි. මේ අනුව මිනිසුන්ට ප්‍රයෝජනයට ගතහැකි ජලය ඇත්තේ සමස්ත ජල තලයෙන් 1%ටත් වඩා අඩු ප්‍රමාණයකි.

තත්වය එසේ තිබියදී මිනිස් ක්‍රියාකාරකම් නිසාම මෙම 1%ට වඩා අඩු ප්‍රමාණයෙන් යුතු ජලයද අපවිත්‍ර වී භාවිතයට නුසුදුසු තත්වයට පත්වෙමින් ඇත. මේ නිසා ලෝකයේ බිලියන 2.2කට ආසන්න ජනතාවක් ආරක්ෂිත පානීය ජලය සඳහා නිසි ප්‍රවේශයක් නොමැතිව ජීවත් වේ. මෙම අපරිසිදු ජල භාවිතය නිසා සෑම වසරකම ළමුන් 1600000 කට ආසන්න සංඛ්‍යාවක් මියයන්නේ අනාරක්ෂිත ජලය, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධ පාචනය නිසාය. මින් වයස අවුරුදු 15ට අඩු ළමුන් 85,700කට ආසන්න සංඛ්‍යාවක් වසරකට මියයයි. එසේම පිරිසිදු පානීය ජල අවශ්‍යතා සපුරාගැනීමට නොහැකි තත්වයක් උද්ගත වීම නිසා වෙනත් ලෙඩ රෝග වැළඳීම හේතුවෙන් වසරකට 485000ක් පමණ මියයන බවද ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තා පවසයි.

ලෝකය එසේ වෙද්දී ලංකාවේ තත්වයද ඊට නොදෙවෙනි නොවේ. ලංකාවේ පවුල් ලක්ෂ 57ක් පමණ සිටින අතර එයින් පිරිසිදු පානීය ජලය ලැබෙන්නේ පවුල් ලක්ෂ 25කට පමණි. තවත් පවුල් ලක්ෂ 07කට පමණ ලැබෙන්නේ අඩක් පිරිසිදු කරන ලද ජලයයි. සෙසු පවුල්වලට ජල ව්‍යාපෘතිවලින් හෝ ජලය නොලැබෙන අතර ජලය නොමැතිව දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින පවුල් ප්‍රමාණය ලක්ෂ 04කි.

මේ නිසා ලාංකීය ජනතාවද විවිධ ලෙඩ රෝගවල ගොදුරු බවට පත්වෙමින් ඇත. හඳුනානොගත් වකුගඩු රෝගය නිසා දිනකට හත් දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මියයන අතර මෙම වකුගඩු රෝගය පානීය ජලය හා අන්තර් සම්බන්ධිත බව බොහෝ පරීක්ෂණ මගින් අනාවරණය වී ඇත. එසේම පාචන රෝගී තත්වයන් මෙන්ම අපිරිසිදු ජල ප්‍රවාහයන් නිසා ඩෙංගු රෝගයද වර්ධනය වෙමින් පවතී. වසරකට ඩෙංගු රෝගීන් 10,000කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වේ.


නිවර්තන වැසි වනාන්තර සහිත, මෝසම් සුළං දෙකකින් වර්ෂාව ලබන, රට පුරා දිවෙන ගංඟා 106ක් තිබෙන, මනාව ජලය රඳවාගත හැකි වැව් 30000ක් පමණ තිබෙන රටක් වුවද අප රටට බීමට හෝ ජලය නොමැතිවන තත්වයට පත්ව ඇත්තේ මෙතෙක් රට පාලනය කළ දේශපාලකයන්ගේ අනුවණ, අදූරදර්ශී ක්‍රියාපිළිවෙත හේතුවෙනි. ඒ වෙනුවෙන් විද්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම තබා, අණ පනත් පවා සම්මත කළේද තමන්ගේ පෞද්ගලික ලාභය වෙනුවෙන්, රටේ ඉතිරිව ඇති වනාන්තර ඇතුළු සෙසු ස්වභාවික සම්පත්ද රටට අහිමිකරලීමට පමණි.

මේ අනුව පානීය ජල මූලාශ්‍ර නොමැති වීම මෙන්ම තිබෙන ජල මූලාශ්‍රද මිනිස් පරිහරණයට නුසුදුසු තත්වයට පත් වී තිබීම සමස්ත ලෝකයේම අනාගත ජීවයේ පැවැත්මට විශාල අභියෝගයක් වී ඇත. 2050 වන විට ලෝක ජනගහනයෙන් 40%කට පමණ ජලය හිඟ ප්‍රදේශවල ජීවත්වීමට සිදුවන බව උපකල්පනය කිරීමට සිදුවීමම බරපතල ඛේදවාචකයකි.

මෙසේ දිනෙන් දින දූෂණය වන්නේ, අහිමි වී යන්නේ, ලෝ තලයෙන් අතුරුදන් වී යන්නේ මිනිස් ප්‍රයෝජනයට ගත හැකිව තිබූ 1%ටත් අඩු ජල සම්පතයි. එසේ වී ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම්වලම ප්‍රතිඵලයක් ලෙසයි. 'දවසේ ලාභය' ගැන පමණක්ම සිතන කර්මාන්ත හිමියන් බහුතරයක් මෙම ජල සම්පත් විනාශයට දායක වන්නේ මිහිතලයේ ජීවිත පැවැත්ම කෙටි කරමිනි.

එසේම අවිධිමත් හා ලාභය උදෙසාම සිදුකරන කෘෂිකර්මාන්තය නිසාද මතුපිට ජල මූලාශ්‍ර පමණක් නොව අභ්‍යන්තර ජල මූලාශ්‍ර පවා විනාශ වෙමින් යන්නේය. අනෙක් ප්‍රධානම කාරණය වන්නේ අවිධිමත් කසළ බැහැර කිරීම්ය. එමගින් අති විශාල ලෙස නිර්මාණය වන නාගරික කසල මහ මුහුද පවා තරණය කර අවසන්ය. ඒවා නැවත මිනිසුන්ට ලෙඩ රෝග හා ස්වභාවික ව්‍යසනයන් ලෙස රැළි පිට රැළි නංවමින් පැමිණෙමින් ඇත.

මෙසේ මිනිසාගේ පැවැත්ම වෙනුවෙන් ප්‍රයෝජනයට ගතහැකි 1%ටත් අඩු ජල පොද මිනිසා විසින්ම විනාශ කර ගැනීම අනාගත ලෝ පැවැත්මේ මහා ඛේදවාචකයයි!. මේ නිසා ලෝක ජල දිනය ලෙස සැමරුමකින් හෝ ආවර්ජනයකින් හෝ පමණක් අපට ඉදිරියට යා නොහැක. එබැවින් ඇත්ත මිනිස් ක්‍රියාකාරකමක ප්‍රතිඵලයක් ලෙස අනාගත ලෝකයේ පැවැත්මට අවැසි ජල පොද සුරැකීම වෙනුවෙන් අප කටයුතු කළ යුතුය. ඉදින් මිනිසා විසින් මිනිසාට ආදරය කරන, රැකබලාගන්නා සමාජයක් ගොඩනැගීම ලෝක ජල දිනයේ සදාකාලික අධිෂ්ඨානය කරගැනීම වඩාත් සුදුසු වන්නේය.



The Gadget

# Fire Extinguisher Ball
# ගිනි නිවන බෝලය




මෙම බෝලය ගිනි නිවන උපකරණයකි. සරලව කියනවනම් මෙය ගින්නට විසි කළ විට, එය තත්පර තුනක් ඇතුළත සක්‍රීය වී ගින්න නිවා දැමීමේ රසායනික ද්‍රව්‍ය සාර්ථක ලෙස විසුරුවා හරිනු ඇත. මෙය ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන අතර අසල සිටින පුද්ගලයින්ට අනතුරු ඇඟවීම සඳහා විශාල ශබ්දයක් පිටකරයි. මෙම විශේෂත්වය නිසා, එය විදුලි පරිපථ යන්ත්‍ර හෝ මුළුතැන්ගෙයි, මෝටර් රථ, හෝටල් වැනි බොහෝ ගිනි අවදානම් ප්‍රදේශවල තැබිය හැකිය. මෙය ක්‍රියාත්මක කිරීමට විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවන අතර කිසිවකුට මෙමගින් කිසිදු අනතුරකට මුහුණදී මටද සිදුවන්නේ නැත. වසර 5ක් තෙක් මෙහි කිසිදු නඩත්තු කිරීමක්ද අවශ්‍ය නොවේ.

Gadget Video

# BMW iX Flow
# පාට වෙනස් කරන වාහනය

ඔබට 1994 දී මිනිසුන්ගේ ඉමහත් ජනාදරයට පත්වුන වුන Viper කතා මාලාව මතකද? එම කතා මාලාවේ තිබුණු කාර් එකට පුලුවන්කම තිබුණා ඕනම අවස්ථාවක එහි වර්ණය වෙනස් කරන්න. ඇත්තටම එදා එහෙම කාර් එකක් තිබ්බෙ නෑ. හුදෙක් පරිගණක භාවිතයෙන් අපේ ඇස් මුලා කිරීමක් පමණයි වුණේ. නමුත් අද එය යථාර්තයක් කරමින් BMW සමාගමෙන් iX Flow නම් මෝටර් රථය නිෂ්පාදනය කර තිබේ. මේ සඳහා ඔවුන් ඉලෙක්ට්‍රොනික තීන්ත (E Ink) තාක්ෂණය භාවිතා කරයි. දුරකථන යෙදුමක් මඟින් පාලනය වන විද්‍යුත් සංඥා මගින් උත්තේජනය වූ විට විවිධ වර්ණක මතුපිටට ගෙන එයි.



# NINU ලොව පළමුවන ස්මාර්ට් සුවඳ විලවුන් වර්ගය




රූපලාවණ්‍යය සහ තාක්ෂණය එකට එකතු වූ විට ඒවා අද්විතීය දෙයක් නිර්මාණය කරයි. NINU යනු ලොව පළමුවන ස්මාර්ට් සුවඳ විලවුන් වර්ගයයි. එය සැලසුම් කර ඇත්තේ ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය හරහා ඔබට අවශ්‍ය සුවඳ ලබා ගත හැකි ආකාරයටයි. මෙම බෝතලය තුළ විශේෂයෙන් සකස් කරන ලද වෙනස් නමුත් අනුපූරක සුවඳ වර්ග තුනක් පවතියි. එමගින් විවිධ සුවඳ සංයෝජන නිර්මාණය කරයි.

# Brave browser - ඇඩ් බ්ලොක් කරන බ්‍රව්සරය..

මේ කියන්න යන්නේ නිදහසේ අන්තර්ජාලයේ සැරිසරන්න පුලුවන් browser එකක් ගැන. ඒ තමයි Brave browser. ඔබ විවිධ browser මේ වන විටත් පාවිච්චි කරල ඇති. සමහර වෙබ්සයිට්වලට යන්න ගියාම ටිකක් slow වෙනවා, ඒ සයිට්වල තිබෙන ඇඩ් එක්ක ගත්තාම. ඉතින් මෙම ඇඩ් බ්ලොක් වෙන නිසාම නිදහසේ අන්තර්ජාලය සැරිසරන්න පුලුවන් වගේම අනෙක් browserවලට සාපේක්ෂව speed එක අතින්ද හොඳ experience එකක් ඔබට Brave browser හරහා ලබාගන්න පුලුවන්. ඒ නිසා Brave browserහි ඇඩ් බ්ලොක් කිරීමේ හැකියාව නිසා ඔබට නිදහසේ අන්තර්ජාලයේ සැරිසරන්න පුලුවන්.

# Photopea
# වැඩ පහසු කරන ඔබ නොදන්නා වෙබ් අඩවියක්

වැඩ පහසු කරන ඔබ නොදන්නා වෙබ් අඩවියක් ගැනයි මේ කියන්න යන්නේ. ඒ තමයි photopea. මෙමගින් ඔයාට photoshop භාවිතා කරලා කරන වැඩ වගේම තවත් ඒ සම්බන්ධ (PSD" AI" XD" sketch" PDF XCF " RAW " ANY) වැඩ බොහෝමයක් කරගන්න හැකියාව ලැබෙනවා. ඔබගේ පරිගණකය කොතරම් පරණ උනත් කිසිම හිර වීමකින් තොරව මෙමගින් වැඩකිරීමේ හැකියාව තිබෙනවා. Adobe සමාගමේ මෘදුකාංග මිලෙන් වැඩි නිසාම එයට විසඳුමක් විදිහට මෙම සේවාව ඔබට නොමිලේ ලබා ගත හැකියි.(link- photopea'com)

# රැඩිකල් වෙමු!

ඔබට මට හිටියේ ගමට කලින් මුලුතැන් ගෙට වඩින මවුවරුන්ය, අතට වෙරලු ඇහිඳගෙන, ඉණට පලා තෙලා ගෙනෙන අම්මලාය. රෙදි වීත්ත, ගවුම්, සායවල් ඇඳි අම්මලාය. ඒ මීට වසර 20කට පමණ පෙරය. ඒ අම්මාවරුන්ට තිබුණේ දරුවන් ගැන, නිවස ගැන, ස්වාමි පුරුෂයා ගැන වගකීම් ගොන්නකි. ඉවීම පිහීම, දරුවන් ඇති දැඩි කිරීම, හේනේ කුඹුරේ වතු පිටි උදලු ගෑම, අස්වනු නෙලීම යන ආදියයි.

නමුත් අද වෙනස්ය. තාරුණ්‍යයේ සිටින අප දකින්නේ කලිසම් ටී ෂර්ට් අඳින, මේකප් කරන, සැලෝන් යන, වාහන පදවන හෝ බස්වල ෆුඩ් බෝඩ් යන, කොණ්ඩ කොටට කපපු, නැත්නම් පාට කරපු, දරුවන් ඩේ කෙයා දාන, ගෑස් ලිපේ හෝ රයිස් කුකර් එකේ බත් උයන අම්මලාය.

බොහෝ යක්බ පුත්තුන්ට මේ අම්මලා ඇලජික්ය. facebook වල ලියන්නේම අතීතකාමයෙන් මත් වී ඉස්සර අම්මා ගැනමය. ඒ අම්මලා පවුය, දුක් වින්දාය, දැන් ගෑණුන්ට සැප වැඩිය, විච්චූරණ වැඩිය, අපේ අම්මා ඒ



කාලේ මෙහෙමය, අපේ ගෑණී මෙහෙමය කියා facebook වල පමණක් නොව ඇතැම් විට කාර්යාලවල, උත්සවවලදී පවා කතාබහට ලක් වනු අසන්නට ලැබෙයි.

ආර්ථික අර්බුදය සමග අම්මලාට දරුවන් සහ නිවස යන වගකීම් මෙන්ම පවුලේ ආර්ථික වගකීමද කරට ගැනීමට සිදුවිය. පවුල තුළ ආර්ථික අර්බුදය එසේ ඇය තම වගකීමක් ලෙස කර පින්නා ගත්තද ඇගේ හිස මත තිබෙන අනෙක් වගකීම්වලින් කොටසක් හෝ පවුලේ අනෙක් සාමාජිකයන් අතර බෙදාගැනීම සාපේක්ෂව සිදු නොවීය. ඒ නිසාම 'අද අම්මාට' නව තත්වයන්ට අනුවර්තනය වීමට සිදු විය.

සාරි පටලාගෙන බස්වල එල්ලීමට නොහැකි නිසා ඔවුන් කලිසමට මාරු විය, ලිපිට පිඹ පිඹ කල් ඇරීමට නොහැකි නිසා රයිස් කුකර්, ගෑස් උඳුන් කුස්සියට වැඩියෝය, කුඩා දරුවන් ඩේ කෙයාර්වලට ඇදුනි. පාන්දර නැගිටගෙන, සතර සුමක්කරය කර, සියලු අර්යාදූදු දරාගෙන බස්වල පැය ගණන් රස්තියාදු වී වැඩ ඇරී එන, ඒත් 'නැවත වැඩට යන' ගැහැණුන්ට ඔවුන්ගේ ගිලිණු ඇස්වල කලු මකන්නට වත්සුන් තවරන්නට සිදුවිය.

අපේ රටේ ආර්ථිකයේ වැඩි පංගුවක් උපයා දෙන ඇඟලුම්, තේ, විදේශ ශ්‍රමිකයින් යන ක්ෂේත්‍ර තුනෙහිම වැඩි පිරිස වන්නේ කාන්තාවන්ය. කාන්තාව මෙසේ නිවසින් ඔබ්බට ගිය, රටේ ආර්ථිකය තුළද සුවිශේෂ කාර්ය භාර්යයක් ඉටු කරද්දී ඔවුන් වෙත සියලු බර පටවා අත පිහදා ගැනීම සිත්පිත් ඇති සමාජයකට කළ හැකිද?. එනිසා කාන්තාව මතම පටවා ඇති පවුල සහ දරුවන් යන වගකීම් 'සමාජීය වගකීම්' ලෙස භාරගෙන කාන්තාව නිදහස් කළ යුතුය!.

දැනුම 12

# අපිට ඇස් ලැබුණේ කොහොමද?

කේම්බ්‍රිය යුගයේ ජීවත් වූ ජීවීන් පිළිබඳව පසුගිය කලාපයේ දී විමසා බැලුවෙමු. එම යුග පිළිබඳ වැඩිදුර තොරතුරු අපි අද සොයා බලමු.

ජලතලය ශාකවලින් ගහනව තිබුණි. ඇතැම් මුහුදු ශාක ගොඩබිම කරා සංක්‍රමණය වීම ආරම්භ වන්නට ඇත්තේ ද මෙකල විය යුතුය. අධි වශයෙන් ගොඩබිම පිහිටි රළු කළුගල් ආදිය මේ යුගය වනවිට හරිත පාසි හා ඇල්ගීවලින් ආවරණය වී තිබෙන්නට ඇත. මෙවක විසූ ඇතැම් ජීවීහු සියුම් සූත්‍රිකා ස්වරූපයක් ගත් ස්පර්ශකවලින් සමන්විත වූහ. පූර්ණ වශයෙන් අන්ධයන් වූ මෙම ජීවීන්ට සතුරා හඳුනා ගැනීමටත් ආහාර හඳුනා ගැනීමටත් උපකාරී වූයේ මෙම ස්පර්ශක සූත්‍රිකාය.

ජීවී පරිණාමයේ ඊළඟ පියවර වූයේ මෙම ස්පර්ශක සූත්‍රිකා ඇස් බවට පරිණාමය වීමයි. සූත්‍රිකා අග පිහිටි ඇස් මගින් පරිසරය වඩාත් හොඳින් හඳුනා ගැනීමටත් ඊට හැඩ ගැසීමටත් ඔවුනට අවස්ථාව ලැබුණි. මෙම පරිණාමයේ ඊළඟ පියවර වූයේ සූත්‍රිකා කෙමෙන් දෘශ්‍ය ඉන්ද්‍රියන් ලෙස වර්ධනය වීමයි. මුලදී සූත්‍රිකාව අග වූ ඇස් කල් යත්ම සූත්‍රිකාව කෙටි වී හිසටම සවි වී එහි වත්මන් ස්වරූපය ගත්තේ ය.

මෙම අවධියේ නොගැඹුරු ජලයේ විසිර සිටි ට්‍රයිලොබයිටයන් හා මුහුදු ගෝනුස්සන්ගෙන් ජලය පිරී ගොස් තිබුණි. ට්‍රයිලොබයිටයින් කලකින් වඳවී ගිය අතර මුහුදු ගෝනුස්සන්ගෙන් කකුළුවන්, පොකිරිස්සන්, ගොඩබිම මකුළුවන් හා ගෝනුස්සන්ගේ පරපුරු බිහි විය.

ජලයේ උතුරා ගිය ජීවය කෙමෙන් කෙමෙන් ගොඩබිම කරා සංක්‍රමණ වීමද මෙම යුගයේ දී ආරම්භ වූ බව පෙනේ. වෙරළට ගොඩගැසූ ජලජ පැළෑටි කෙමෙන් කෙමෙන් ගොඩබිම පරිසරයට හුරුවෙමින් මුහුදු වෙරළ ආක්‍රමණය කරන්නට ඇත. දිය සෙවල හා පාසිවලින් ආරම්භ වී කඩොලාන තෙක් මෙම පැළෑටි වර්ධනය විය.

කේම්බ්‍රිය යුගයේ මුල් භාගය වන විට රොඩීනියා මහද්වීපය හෙවත් පැන්ජියාව කොටස් කිහිපකට බෙදී ගොඩනැගුණු මහද්වීප කිහිපකින් සමන්විත විය. පැන්තලේෂියන් මුහුදින් වටවූ මෙම මහද්වීප අතරින් විශාලතම ගොඩ්වානාවට වත්මන් දකුණු ඇමෙරිකාව, උතුරු ඇමෙරිකාවේ හා අප්‍රිකාවේ කොටස් කිහිපයක්, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, ටිබැටය, දකුණු යුරෝපය, දකුණු අරාබිය, තුර්කිය, ඉරානය ඇතුළු බිම් පෙදෙස් අයත් විය. ඉතිරි මහද්වීප වූයේ බෝල්ටිකාව, කසකස්තානය, චීනය හා සයිබීරියාව යන මහද්වීපය. එක් භූමි ප්‍රදේශයක සිටි ජීවීන් විවිධ භූමි ප්‍රදේශ අතර විසිර යාම මෙම යුගයේ ඇති වූ ජෛව විවිධත්වයට ප්‍රධාන හේතුවක් වන්නට ඇත. එසේම විවිධ දේශගුණික තත්වයන්ට ඔරොත්තු දෙන අයුරින් හැකියා වර්ධනය කර ගැනීමටද ඔවුන්ට අවස්ථාව සැලසෙන්නට ඇත.

තවද, බෝල්ටිකාව හා චීනය හැර ඉතිරි සියලු ගොඩබිම් ප්‍රදේශ ධ්‍රැව ප්‍රදේශවලින් ඉවතට ඇදී නිරක්ෂය ආශ්‍රිත ප්‍රදේශවලට එක්රොක් වීම මෙම යුගයේ සිදු වූ තවත් සුවිශේෂී සිදුවීමකි. ගොඩබිම් අතුරින් බෝල්ටිකාව හා චීනය හැර ඉතිරි ගොඩබිම් සියල්ල නිරක්ෂය මැදිකොට ගෙන පිහිටා තිබුණි. මේ නිසා ධ්‍රැව ප්‍රදේශවල හිම කඳු දියවී මුහුදු මට්ටම ඉහළ නගින්නට ඇත. එහි ප්‍රතිඵලයක් වූයේ චීනය, සයිබීරියාව, ලොරෙන්තියාව වැනි මහද්වීපවල පහත්බිම් විශාල වශයෙන් මුහුදුබත් වීමයි.

කේම්බ්‍රිය යුගය මෙතකින් නිමා වන අතර ඕර්ඩොවිසීය යුගයේ තොරතුරු රැගෙන ලබන කලාපයේ දී හමුවෙමු.





Sports

# ප්‍රේක්ෂකාගාරයේ සිට ලියමි.

අපි ඩන්කන් වයිට් කුලුඳුලේ ගෙනත් දුන් ඔලිම්පික් පදක්කමින් පසු වසර 74ක් පුරාවට මලල ක්‍රීඩාවේ පදක්කම් අහේනියක සිටියෙමු. එය නිමාකොට සුසන්තිකාගේ ඔලිම්පික් පදක්කමත් සමඟ ප්‍රේක්ෂක අපි උන්මාදයට පත් වීමු. සීමාසහිත පහසුකම් යටතේ වුවද දර්ශලා, ශ්‍රියානිලා, සුගත්ලා අපිට යම් අස්වැසිලක් ලබා දුනි. නමුත් නැවතත් මලල ක්‍රීඩාවේ ජයග්‍රහණ නොමැතිව ක්‍රීඩකයින්ද, ප්‍රේක්ෂක අපිද නිසොල්මනේ බලා සිටින්නෙමු.

ක්‍රිකට් ගැනද අපි උද්දාමයට පත්ව සිටියෙමු. 96දී ක්‍රිකට් කිරුළ ලබාගැනීමත් සමඟ අපිට ලෝකයේ උරුම ක්‍රීඩාව ක්‍රිකට් බවට පත්තර මුල් පිටු පුරවමින් සිටියෙමු. ඒ උන්මාදයටද වැඩි ආයුෂ නොලැබුණෙන්, අපි නැවතත් උඩ බලමින් සිටින්නෙමු.

කොරෝනා ව්‍යසනයෙන් පසු ජෛව බුබුළු ආරක්ෂණ යාන්ත්‍රණයක් සකස්කරමින් ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ කළත් මලල ක්‍රීඩා සහ අනිකුත් ක්‍රීඩාවන්ට ලැබුණේ කුඩම්මාගේ සැලකිලිය. එසේ ආරම්භ කළද, ක්‍රීඩා ඇමතිගේ සිට ව්‍යාපාරික මහතුන්ගේ දෑත් දිගු කරමින් මුදල් වියදම් කළද, සියල්ල නිෂ්ප්‍රභා කරමින් ක්‍රිකට් ක්‍රීඩාව දිනෙන් දින වලපල්ලට යමින් ඇත. ප්‍රේක්ෂකාගාරය නිසොල්මනේ බලා සිටී. කටමැත දොඩවන දේශපාලකයින් පිරිසක් සහ ඊට අනුබල දෙන නිලධාරි රොත්තක් පමණක් ඇත.

සමස්ත ක්‍රීඩාවම මෙසේ වලපල්ලට යවන තෙක් අපි නිහඬව බලා සිටිය යුතු නොවේ. මේ අපි හඬ අවදි කළ යුතු කාලයයි. නැතහොත් අපිට උඩ බලා සිටීමට ප්‍රේක්ෂකාගාරයද අහිමි වනු ඇත.



# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සුදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## වොල්ගාව දැරූ ඇස

වොල්ගාව දැරූ බිම
ඇගේ දරුවන් එක්ක
බාල වියෙ ඉඳන්ම
හිත බර කරා ප්‍රේමයෙන්..

රුධිරයෙන් ආවද
ගෝර්කි කියා දුන්නාද
නොදන්නෙමි හරියටම
ඒත් ඈ මගේ ළය
පිබිදුවා අමුතු වේගෙකින්..

අප්පච්චිගේ කතන්දර එක්ක
මිහිරි සුවඳැති නවකතා පිටු
ජීවිතේ ස්ටෙප්ස් බිම
ඇගේ සුළඟින් පිරවිය..

අද ඒ තෘණ බිමෙන් මා
ගව් ගණන් ඈත විත් බලා ඉමි
ඈ තවම වොල්ගාව දරන්නී
දරුවනුත් වදන්නී..

ඒත් මේ ඇය නොවේ..

වියවුල්ව වියරුවී
බිඳුණු මේ ඇය නොවේ
මගේ ආදර ඇය නොවේ...

]සඳුනි නුවන්තිකා - කොළඹ[

## අම්මාවරු

නෙක කතා, බැනුම්
අහගෙන රටෙන්, ලෝකෙන්
ගෙදර හැමගෙන්..
හරියටත් වැරදි,
වැරදියටත් වැරදි..
කුස්සියේ,
නිහඬව හැඬූ අම්මා..
පාන්දර නිදාගෙන,
පාන්දරම ඇහැරුණ
ඉරටත්, සකළයින්ටත්
අපිටත්,
ඇහැරවපු...
බැනුම් අහගෙන,
ඇස් තෙමාගෙන,
අගක් මුලක් නොදැනත්
කිසිත් නොකියන..
ඒත්,
හැම වැඩකම මුලපුරන
අම්මා..
ඉවසීම,
කුමක්දැයි කියාදුන්
ආදරේ නිහඬවම
මෙනෙහි කළ
අම්මා...

] බුද්ධික සම්පත් - අනුරාධපුර[

## ලංකාව

සුළඟ ගෙන තව තවත්
පිම්ඹම බැලුමකට
එය තවත්,
තව තවත්
පිම්ඹේය හරි හැඩට

බලපුවම හරි හැඩයි
බලන අය හොඳ කියයි
පුම්බන අයත් එය
බල බලා හැඩ කියයි

ඔහොම යනකොට තැනක
පිපිරුවා ගොස් ඉමට
ණය අරන් පිම්බිච්ච
වගෙ අපේ ලංකාව

] නිහාල් සෙනරත්[



## ජීවන අරගල

අතකින් සාරි පොටය
අතකින් බස් එක අල්ලාය
පස්සෙන් පිටට තද වෙන
ජැක්මා ය..
ඔසවා උකුලක තියු
පෙර පාසල් දරුවාය..
අතකින් රතු පෑනක් ගත්
බොස් මගය..
අත් සොලසක් නැති ගැහැණුන්
පැණි කෑහ..

]යශෝධා සමරධීර - අම්පාර[

## නැසෙන දේශය

වැසියන් නඟන හඬට
දෙකන් නොඇසෙන තරමට
හැට පැන්න කාලෙට
බිහිරියි පාලක මෙරට

වැසියන්ගෙ දුක නොඇසී
දොඩනා බස් ය වහසී
පාලක ගතිය සැහැසී
කල් වැසි දැනට නොවසී

ගිනි අකුණු සහිත
අකල් වැසි පතිත
බොරුව,සොරකම පැවත
රටක් නැගිටීද නැවත?

රටක් ගැන නොහිත
පාලක මෙරට අහිත
දෙවි බඹුන් මවිත
පලායනු ඈත ඉවත

] අනුර ගාල්ලෙවත්ත - කතරගම[

## අවශේෂිත නූතනය ...

පුරසාරම්ය දුබලයන් වෙත
බලවතුන්ගෙ වහසියට
ඔවුනොවුන් පොරබදනා
විනෝදයේ මිනිත්තුය

පොර පිටිය කරගත්
දුබල ගොදුරු මත ....

පුරා බිමක පිපි
රක්ත පැහැ මල්
ලෝකයක් හට සුවඳ
විහිද ලු අතීතයක් ....
නමුදු අද
රක්ත පැහැ ගත්
රුහිරයෙ වේදනා රැල්
මවයි එදා එලෙස
වූ ඔවුන් ....

] බුද්ධික ලක්ෂාන් හේරත් -
කුරුණෑගල [




# නේටෝ උගුලේ යුක්රේනය හිරවේ

යුක්රේනය යනු නැගෙනහිර යුරෝපයේ පිහිටි යුරෝපයේ දෙවන විශාලතම රට වේ. දකුණින් කළු මුහුද සහ අසෝව් මුහුද, නැගෙනහිරින් සහ උතුරින් රුසියාව, බටහිරින් පෝලන්තය, ස්ලෝවැකියාව සහ හංගේරියාව, උතුරින් බෙලරුස් සහ දකුණින් රුමේනියාව සහ මෝල්ඩෝවාටද මායිම් වේ. අද වනවිට ලෝකයේ තීරණාත්මක රටක් බවට යුක්රේනය පත්වී ඇත. මන්දයත් එහි පිහිටීමේ ඇති උපාය මාර්ගික වැදගත්කමයි. රුසියාව සහ යුක්රේනය අතර පවතින මෙම අර්බුදය ගෝලීය අර්බුදයක් දක්වා වර්ධනය වී ඇත. රුසියාව ලක්ෂයකට අධික හමුදාවක් යුක්රේනයේ දේශසීමා අසල ස්ථානගත කරමින් ආරම්භ වූ මෙම ගැටුම අද වනවිට යුක්රේනය ආක්‍රමණය කිරීමක් දක්වා වර්ධනය වී ඇත. එපමණක් නොව රුසියාව යුක්රේනයට අයත් ඩොනේට්ස් සහ ලුගාන්ස් වෙනම ජනරජයන් ලෙස ප්‍රකාශයට පත්කොට එම රජයන්ගේ ආරක්ෂාවට රුසියානු හමුදාව යවා ඇත.

සෝවියට් දේශයට අයත් සමූහාණ්ඩුවක් ලෙස මොස්කව්හි කොමියුනිස්ට් පාලනය යටතේ පැවතුන යුක්රේනය 1991දී සෝවියට් සංගමයේ බිඳ වැටීමත් සමග ස්වාධීන රටක් බවට පත්විය. මෙම වෙන්වීමත් සමඟ ඇමෙරිකාව ප්‍රමුඛ යුරෝපා සංගමය වෙත වැඩි නැඹුරුවක් දැක් වුවද යුක්‍රේනයට රුසියාව සමඟ තිබුණු සමාජ, සංස්කෘතික බැඳීම්වලින් ඉවත්ව යාමට නොහැකි විය. 1991 සිට 2014 දක්වා යුක්රේනය පාලනය වූයේ රුසියානු හිතවාදී දූෂිත ධනපති කඳවුරකිනි. ඔවුන් රුසියාව සමඟ දේශපාලනික, ආර්ථික, සංස්කෘතික වශයෙන් ප්‍රබල සම්බන්ධතාවයක් පැවැත්විය. එම දූෂිත පාලනය හා බරපතල ආර්ථික අර්බුදය හමුවේ පැනනැගුනු ජන අරගලය භාවිතා කරමින් එක්සත් ජනපදය මැදිහත්ව Euro maiden ව්‍යාපාරය හරහා ඇමෙරිකානු හිතවාදී, නව නාසිවාදී, අන්ත ජාතිවාදී කණ්ඩායමක් බලයට ගෙන ඒම සිදුවිය.

මේ සමඟ යුක්රේනයේ පිහිට වූ ජාතිවාදී ආණ්ඩුව විසින් රුසියානු භාෂාව කතාකරන ජනතාවට එරෙහි පළිගැනීම්, අසමාන සැලකීම් ඇති කළේය. ඇතිවූ ජාතික, ආගමික, සංස්කෘතික පීඩනයට එරෙහිව යුක්‍රේනයේ නැගෙනහිර කොටසේ ජීවත් වූ රුසියානු සම්භවය සහිත ඩොන්බාස් ප්‍රාන්තයේ සිටි ධනේශ්වර දුෂිත පාලකයන් යුක්රේන් ආණ්ඩුවට එරෙහි සන්නද්ධ දේශපාලන අරගලයක් ආරම්භ කරන ලදී. මෙම ඩොන්බාස් කැරලිකරුවන් ලොව වෙනත් කිසිම කැරලි කණ්ඩායමකටත් වඩා ප්‍රබල හා ආරක්ෂිත පසුබිමක සිටියේ රුසියාවේ ආධාර නිසාවෙනි. එමෙන්ම ක්‍රිමියාවේ සිදුවූ ජාතිවාදී කැරලි සමඟ රුසියාව ක්‍රිමියාව ආක්‍රමණය කොට තම රටට ආඳාගන්නා ලදී.

සෝවියට් සංගමයේ බිඳවැටීමත් සමඟ වෙන්වූ සෝවියට් සංගමයට අයත් රටවල් නේටෝ සංවිධානයට බඳවා නොගැනීමට පැවති සම්මුතිය අමු අමුවේ කඩකරමින් පෝලන්තයටත්, එස්තෝනියා, ලිතුවේනියා, ලැට්වියා යන බෝල්ටික් රටවල් නේටෝවට සම්බන්ධ කර ගැනීමටත්, එම රටවලට හමුදා යැවීමටත් නේටෝව කටයුතු කරන ලදී. ඒ රටවල් සියල්ල නේටෝවට අයිත් බැවින් ඒවා රුසියානු බලපෑමෙන් මුදවාගැනීමේ වගකීම නේටෝවට පැවරිණි. නමුත් යුක්රේනය යනු තවම හ්ඔධ **partner** රටක් පමණයි. තවම ඔවුන්ට **NATO** සාමාජිකත්වය ලබා දී නොමැති තත්වයක් තුළ ඇමරිකාවේ උවමනාව මත තවත් **NATO** රටවල් 7ක් සමඟ එකතු වී මහා පරිමාණයේ ගුවන් හමුදා අභ්‍යාසයක් කිරීමට යුක්රේනය කටයුතු කරන ලදී. මේ සමඟ රුසියාව සහ යුක්රේනයේ අර්බුදය තව තවත් වර්ධනය විය. මන්ද එය රුසියාවේ ආරක්ෂාවට තර්ජනයක් වන බැවිනි. එනිසා යුක්රේනය යුරෝපා සංගමය(**EU**) සමඟ එකතුවීමට මෙන්ම නේටෝ සාමාජිකත්වය ලබාගැනීමටද රුසියාව විරුද්ධ විය.

යුක්රේනයට **NATO** සාමාජිකත්වය ලබා දුනහොත් අනිවාර්යයෙන් තම හමුදා යුක්රේන දේශසීමාවේ රුසියාවට එරෙහිව රැඳවීමට නේටෝවට සිදුවෙයි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව විශේෂයෙන් න්‍යෂ්ටික බලවතුන් අතර යුද්ධ ඇති වීමට සියලු දෙනා අකමැතිය. ඩොන්බාස් ප්‍රාන්තයේ ඡන්දය පවත්වා මිනිසුන්ට කැමති තීරණයක් ගැනීමට ඉඩ ලබා දිය යුතු බව රුසියානු මත විය. ඡන්දය යනු ප්‍රජාතන්ත්‍රවාදයේම අංගයක් වේ. අනිත් අතට රුසියාවට එරෙහි යුද්ධයකට NATO රටවල්ද එකඟ නොවේ. එනිසා යුක්‍රේනයට **NATO** සාමාජිකත්වය හෝ EU සාමාජිකත්වය ලබාදීම උවමනාවෙන්ම මඟහරින බව පෙනීයයි.

ආයුධ, අමුද්‍රව්‍ය වෙළඳපොල වෙනුවෙන් ලෝකයේ කොහේ හෝ යුධයක් ඇවිලවීම එක්සත් ජනපදයේ අරමුණයි. අද වනවිට මෙම අර්බුදය තෙවන ලෝක යුද්ධයක මුව විටට පැමිණ සිටී. ලෝක බලවතුන් එක්පසකින් යුක්රේනයට යුධ ආධාර සපයයි. අනෙක් පසින් රුසියාවට විරුද්ධව සම්බාධක යොදමින් පවතී. අද වනවිට රුසියාව, න්‍යෂ්ටික අවි භාවිතා කරන බවට තර්ජනය කරනවා පමණක් නොව එම අවි දේශසීමා අසල ස්ථානගත කොටද ඇත.

ප්‍රජාතන්තවාදයේ මුවාවෙන් සිදු කරන ආක්‍රමණයන් දැඩිසේ හෙළා දැකිය යුතු මෙන්ම එයට විරුද්ධව නැගී සිටීමට කාලය එළඹ ඇත. සෝවියට් සමූහාණ්ඩුව පවතින විට ලෝකය තුළ, "ප්‍රති සමතුලිතතාවයක්" පැවතිනි. සාමයට සහ ජනතාවගේ මිත්‍රත්වයට සැබැවින්ම පක්ෂව බලවත් බලයක් තිබුණි. නමුත් එය පෙරලා දැමීමෙන් පසු ජාත්‍යන්තර බල තුලනය විශාල ලෙස වෙනස් විය.

සැබැවින්ම ලෝකයේ බලවත් ලොකු කුඩා රාජ්‍යන් තම බල තණ්හාව වෙනුවෙන් තම ජනතාවගේ ජීවිත පරදුවට තබා පාලකයන්ගේ අවශ්‍යතාවය අනුව කටයුතු කරන බව ජනතාව අවබෝධ කරගත යුතුය. එපමණක් නොව මෙම බල අරගලයේ මිල ගෙවීමට සිදුවන්නේ ජනතාවට තම ජීවිත වලින් බවද පෙන්වාදිය යුතු වේ. එසේනම් ලෝකයේම ජනතාව සාමය සඳහා වන අරගලයට පෙළගැසිය යුතුය. 1999 දී, යුරෝපයේ හදවත වූ යුගෝස්ලාවියාවට නේටෝ, ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ ඔවුන්ගේ සහචරයින් විසින් බෝම්බ හෙලීම මෙන්ම අද, 2022 දී රුසියාව අසාධාරණ හා විනාශකාරී යුද්ධයක දී යුක්රේනයට පහර දීමද ඒ සඳහා නේටෝව ප්‍රමුඛ රජයන්ගේ මැදිහත්වීමද එකම කාසියේ දෙපැත්තක් වේ.

එබැවින් යුක්රේනයේ යුද්ධය අවසන් කරන ලෙස ලෝකය බලවතුන්ට බලකිරීමත්, රුසියානු ප්‍රහාරත් දැන් නැවැත්විය යුතු අතර නේටෝව විසුරුවා හැර, ඕනෙම රටකට තම රටේ වර්තමානය සහ අනාගතය සඳහා තනිව තීරණය කිරීමට ඇති අයිතිය තහවුරු කළ යුතුය. එමෙන්ම එක්සත් ජනපදයේ සහ නේටෝවේ රූකඩයක් වන යුක්රේන ආණ්ඩුවේ ෆැසිස්ට් භාවිතාවන්ටද එරෙහි විය යුතුය. රුසියාව, යුක්රේනය සහ සියලුම රටවල ජනතාව මිත්‍රත්වයේ සහ සහයෝගීතාවයේ සබඳතා තුළින් සාමය වර්ධනය කිරීමට නැගී සිටිය යුතුය. අධිරාජ්‍යවාදී ප්‍රතිවිරෝධතාවලට එරෙහි පොදු අරගලයට සියලු ලෝකවාසී ජනතාව එක්ව නැගී සිටිය යුතු කාලය එලැඹ ඇත. අධිරාජ්‍යවාදී යුද්ධවලින් සහ සුරාකෑමෙන් තොර, ලෝක සාමය හා සාධාරණත්වය සඳහා වන අරගලය තීව්‍ර කිරීමට කාලය එලැඹ ඇත. ඒ සඳහා ලොව පුරා සිටින සියලුදෙනා එක්ව නැගී සිටිය යුතුය!.



## ආගම බිහිවීම-12 කොටස

පසුගිය කලාපයෙන් අප වෙත ගෙන එනු ලැබුවේ නබිතුමාගේ මරණයෙන් පසුව අනුප්‍රාප්තිකයෙක් නොමැතිවීම නිසා කාලිෆ් තනතුර සඳහා ඇති වූ අර්බුදකාරී තත්වයන් පිළිබඳවය.

# අලි කාලිෆ් තනතුර සඳහා පත්වීම

උත්මාන්ගේ මරණයෙන් පසු කැරලිකරුවන් කාලිෆ් තනතුර සඳහා අලිට ආරාධනා කළ අතර අලි එය ප්‍රතික්ෂේප කළේ කැරලිකරුවන් සමඟ ගනුදෙනු කිරීමට ඔහු අකමැති වූ බැවිනි. නමුත් කාලිෆ්වරයෙක් පත් නොවීම නිසා අරාජික තත්වයක් ඇතිවූ හෙයින් පසුව අලි කාලිෆ් තනතුර භාරගනු ලැබීය.

මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් අලිව කාලිෆ්වරයා ලෙස පිළිගත් නමුත්, උත්මන්ගේ ගෝත්‍රයේ සාමාජිකයන් අලිව නොපිළිගත්හ. අයේෂා සහ උත්මාන්ගෙ ගෝත්‍රයේ සාමාජිකයන් කැරලිකරුවන්ට දඬුවම් දෙන ලෙස අලිගෙන් ඉල්ලා සිටි නමුත් ගැටුම් දුරදිග යන නිසා අලි එය ප්‍රතික්ෂේප කළේය. එවිට අයේෂා සහ උත්මන්ගේ පිරිස විශාල හමුදාවක් රැස් කොට බස්රා නගරය අසල කඳවුරු ලෑහ. මුස්ලිම් සමාජයේ ප්‍රධාන සහ වැදගත් පුද්ගලයන් රැසක් ඔවුන් හා එක් වූහ. මේ සඳහා අයේෂාගේ පියා වූ අබුබකර් සහ අලි අතර තිබූ පැරණි ගැටුමද හේතුවක් විය. අලිද තම හමුදාව රැගෙන පැමිණි අතර දෙකොටස අතර විශාල සටනක් ඇති විය. මෙය හැඳින්වූයේ 'ඔටුවාගේ සටන' ලෙසිනි. ඊට හේතුව කැරලි හමුදාව මෙහෙය වූ අයේෂා ඔටුවෙක් පිට නැගී සටන් බිමට ආ හෙයිනි. සටනින් අලි ජයගත් අතර කැරලි නායකයන් විශාල ප්‍රමාණයක් මිය ගියද අයේෂාගේ ජීවිතය බේරුණි.


**පළමු ෆිත්තාව හෙවත් සිවිල් යුද්ධය (ක්‍රි.ව. 644 - ක්‍රි.ව.661)**

මෙම සටනින් පසු අලි මුස්ලිම්වරුන් අතර විශාල ජනප්‍රියත්වයක් අත් කර ගත් අතර ඔහුගේ දේශපාලන ප්‍රතිපත්ති හා බදු සංශෝධන ඒ සඳහා බලපාන ලදී. අලිගේ ආධාරකරුවන් හැඳින්වූයේ "ෂියා අලී" හෙවත් අලිගේ පාර්ශව නමිනි. සිරියාව ආශ්‍රිතව විසූ උත්මන්ගේ ආධාරකරුවන් උත්මන්ගේ මස්සිනා වූ මුවාවියත්ගේ නායකත්වයෙන් තව කැරැල්ලක් ආරම්භ කළහ. එවකට සිරියාවේ ආණ්ඩුකාරයා වූයේ මුවාවියත්ය. ඊජිප්තුවේ ප්‍රධානියා වූ අමාර් ඔවුන්ට සහාය පළ කළේය. මෙය පළමු සිවිල් යුද්ධය ලෙස හැඳින්වේ.

සටන් කීපයකින් පසු ස්ථිර ජයක් ලැබීමට දෙපාර්ශවයම අපොහොසත් වූ නිසා සාකච්ඡා ඇති වූ නමුත් ප්‍රතිඵලයන් නොලැබුණි. අලි කැරලිකරුවන්ට එරෙහිව දිගටම යුද්ධ කිරීමට අකමැති බව පෙනුන නිසා දැඩි මතධාරී පිරිස් අලිගෙ කණ්ඩායමෙන් ඉවත් විය. ඔවුන් "කරිජයිට්වරු" ලෙස හැඳින්වේ. කරිජයිට්වරු අලි සහ මුවාවියත් යන දෙදෙනාට එරෙහිව සටන් කළ අතර ක්‍රිස්තු වර්ෂ 661 කරිජයිට් ඝාතකයන් විසින් අලිව මරා දමන ලදී. අලිගෙ මරණයෙන් පසුව පළමු කාලිෆ් රාජ්‍ය වූ රෂිදුන් කාලිෆ් රාජ්‍ය සමය අවසන් වූ අතර ඉන්පසු ඇරඹුනේ උමයියාඩ් කාලිෆ් රාජ්‍යයයි.



## පෘථිවි අභ්‍යන්තරය ගැන නවතම අනාවරණයක්!



පෘථිවි අභ්‍යන්තර හරය ද්‍රව සහ ඝන අතරමැදි අවස්ථාවේ පවතින කලාපයක් ලෙස පවතින බව චීන විද්‍යා ඇකඩමියේ සිදු කළ නවතම පර්යේෂණවලින් හෙළිකර තිබේ. මේ බව අනාවරණය වී ඇත්තේ භෞතික විද්‍යාඥයකු වූ යු හෙ ප්‍රමුඛ විද්‍යාඥ කණ්ඩායමක් විසින් පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භූ කම්පා දත්ත විශ්ලේෂණය සඳහා සිදුකළ පරීක්ෂණයකදීය. ඒ අනුව හයිඩ්‍රජන්, ඔක්සිජන්, කාබන් යන මූලද්‍රව්‍යවලින් යුත් ඉතා ඉහළ විද්‍යුත් සන්නයනතාවයකින් සමන්විත ඝන හා ද්‍රව අතරමැදි කලාපයක් බව එම විද්‍යාඥයන් පෙන්වා දී තිබේ.


## ඉක්වදෝරය ස්ත්‍රී දූෂණයකදී ගබ්සා කිරීමට අවසර දෙන රෙගුලාසි අනුමත කරයි..



ඉක්වදෝර නීති සම්පාදකයින් විසින් ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් ගබ්සා කිරීම් සඳහා ප්‍රවේශය ලබාදීමේ රෙගුලාසි අනුමත කර ඇති අතර, එවැනි ගබ්සා කිරීම් සාපරාධී නොවන බවට ව්‍යවස්ථාපිත අධිකරණ තීන්දුවක් ලබා දී ඇත. 1938 වසරේ සිට ඉක්වදෝරයේ ගබ්සාව නීත්‍යානුකූලව පවතින්නේ කාන්තාවකගේ ජීවිතය අවදානමට ලක්වන අවස්ථාවකදී හෝ ස්ත්‍රී දූෂණයෙන් දිවි ගලවා ගත් අයකුගේ බුද්ධිමය ආබාධිත තත්වයකදීය. සෑම වසරකම ඉක්වදෝරයේ ගබ්සා කිරීම් 21,000කට වඩා සිදු වන අතර ඒවායින් බොහොමයක් භයානක නීති විරෝධී සායනවල සිදු වේ.

ආර්ජන්ටිනාව සහ උරුගුවේ යන රටවල යම් කාල සීමාවන් යටතේ ගබ්සාව නොමිලේ ලබා ගත හැකි අතර තවත් ලතින් ඇමරිකානු රටවල් කිහිපයක් ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් එය නීතිගත කර ඇත. මෙක්සිකෝවේ ශ්‍රේෂ්ඨාධිකරණය පසුගිය වසරේ ගබ්සාව සාපරාධී නොවන බව ප්‍රකාශ කළ අතර කොලොම්බියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය එම තීන්දුවම කිරා මැන බලමින් සිටී. ස්ත්‍රී දූෂණ සහ අනෙකුත් සීමිත අවස්ථා සඳහා ගබ්සාවට අවසර දී ඇති චිලියේ, ජනාධිපති ලෙස තේරී පත් වූ ගේබ්‍රියෙල් බෝරික් එය නිදහසේ ලබා දීමට පොරොන්දු වී තිබේ.

## ටියුනීසියාවේ කම්කරු සංගමය Noureddine Taboubi නැවතත් නායකයා ලෙස තෝරා පත්කරගනී.



ටියුනීසියාවේ බලගතු UGTT කම්කරු සංගමයේ නායකයා ලෙස Noureddine Taboubi නැවත තේරී පත් වූයේ එය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකි තීරණාත්මක ජාතික හැරවුම් ලක්ෂ්‍යයකට ළඟා වන විටය. වසර පහක් තිස්සේ UGTT නායකයා ලෙස Taboubi කටයුතු කරන ලදී.

මිලියනයකට වඩා සාමාජිකයින් සිටින, වැඩවර්ජන මගින් ටියුනීසියාවේ ආර්ථිකය වසා දැමීමේ හැකියාව ඇති UGTT, රටේ බලවත්ම දේශපාලන ක්‍රීඩකයා සහ ජනාධිපති අධිකාරියට ඔරොත්තු දිය හැකි දුර්ලභ සංවිධානයක් ලෙසද සැලකේ.

අරාබි වසන්තය අවුලුවාලීමෙන් පසුව, භයානක විදි ධ්‍රැවීකරණය වැළැක්වීම සඳහා වෙනත් සිවිල් සමාජ කණ්ඩායම් සමගද සම්බන්ධ වී ඉටු කළ කාර්යභාරය වෙනුවෙන් 2015 දී නොබෙල් සාම ත්‍යාගය දිනාගැනීමටද UGTT සමත්විය.

වමට

# සංස්කෘතිය තුළ අතරමං නොවෙමු

මිනිසා සංස්කෘතික සත්වයකු යන්න, පිළිගත් පොදු මතයයි. ලෝකයේ ජීවත්වන සියලු ජීවීන් අතරින් සංස්කෘතියක් ගොඩනගා ගත්, සංස්කෘතික සබඳතා තුළ ජීවත්වන එකම සත්වයා වන්නේද මිනිසායි. එය මිනිසා ලද ඓතිහාසික ජයග්‍රහණයකි. නමුත් වර්තමානයේ මිනිසා අතීත සංස්කෘතික ලක්ෂණවල සිරකරුවෙකු බවට පත් වී හෝ සංස්කෘතික පිරිහීමක ගොදුරු බවට පත් වී හෝ සිටී. එය මානව සංහතියේ පැවැත්මට හිතකර වී නැත. සංස්කෘතිය සහ සමාජය පිළිබඳ නිවැරදි කියැවීමක් අවශ්‍ය වන්නේ එබැවිනි.

සංස්කෘතිය පිළිබඳ සමාජයේ බොහෝ දෙනා තුළ ඇත්තේ අසම්පූර්ණ අදහස් රැසකි. ලියොන් ට්‍රොට්ස්කි විසින් සංස්කෘතිය යන්නේ සමස්ත අදහස එක එල්ලේ, නිරවුල්ව ප්‍රකාශ කර තිබේ. ඒ, "මිනිසාගේ සමස්ත ඉතිහාසය තුළ දී සොබාදහම විසින් දෙන ලද දෙයට පටහැනිව, මිනිසා විසින් නිර්මාණය කරන ලද, උගන්නා ලද හා ජයග්‍රහණය කරන ලද සියල්ල සංස්කෘතිය වේ" යන්නයි.

මාක්ස්වාදී දෘෂ්ටියට අනුව එය සරලව ගත්විට "සිය ඉතිහාසය තුළ මිනිසා විසින් අත්කරගන්නා ලද සියලුම අධ්‍යාත්මික හා ද්‍රව්‍යමය වටිනාකම්වල එකතුව සංස්කෘතිය වේ".

සංස්කෘතිය සමස්ත මානව වර්ගයා විසින්ම ගොඩනගන ලද දෙයකි. එහෙත් එය ලොව පුරා පවතින්නේ එක හා සමාන ආකාරයට නොවේ. එය රටින් රටට, විවිධ කලාපවලට, විවිධ කාලවලට අනුව විවිධත්වයක් පෙන්නුම් කරයි. මෙසේ සංස්කෘතික විවිධත්වයට හේතු වන ප්‍රධාන සාධක දෙකක් තිබේ.

1. නිෂ්පාදන උපකරණවල සංවර්ධනයේ මට්ටම හෙවත් සමාජ සංවර්ධනයේ මට්ටම
2. විවිධ රටවල සහ විවිධ කලාපවල පවතින භූගෝලීය වෙනස්කම්

ඒ අනුව සංස්කෘතිය යනු විවිධත්වයේ ඒකත්වයකි. එමෙන්ම එය ඒකත්වයේ විවිධත්වයකි. සංස්කෘතියේ වටිනාකමත්, එහි අලංකාරයත්, සජීවී බවත් පවතින්නේ මෙම විවිධත්වය තුළය. සංස්කෘතිය මෙම විවිධත්වය සහිතව ඓතිහාසිකව පරිණාමය වේ. සංස්කෘතිය යනු එකතැන පවතින ඝනීභූත දෙයක් නොවේ. නිතිපතා වෙනස්වන ප්‍රපංචයක් බැවින් එය තව තව දේ එකතු කරගන්නා අතරම අතීතයෙන් උරුම වූ පැරණි දේද ඒ තුළ රඳවා ගනී. ඒ අතරම නව තත්වයන්ට නොගැළපෙන පැරණි දේ අභාවයට යවමින් වර්ධනය වේ.

සංස්කෘතිය යනු අතීත ශ්‍රී විභූතිය පමණක් නොවන්නා සේම අතීතයෙන් තොර වර්තමානයක්ද නොවේ. එය අතීතය තුළම ගැබ්ගත් වර්තමානය වෙයි. අති පිරිසුදු සංස්කෘතියක් පිළිබඳව හෝ අතීත සංස්කෘතියක විභූතිය ගැන හෝ හඬා වැළපෙන්නේ මෙම සත්‍ය වටහා නොගත් අයයි.

සැබෑ ලෙසම සංස්කෘතික පරිහානිය යනු අතීතයේ පැවැති දේ වෙනස් වී තිබීම නොවේ. මානව සංහතියේ පැවැත්මට, එහි සංවර්ධනයට, මිනිසාගේ සාමූහික ක්‍රියාකාරීත්වයට සේවය කළ යුතු සංස්කෘතික ලක්ෂණ එසේ නොකොට ඒවාට බාධා කිරීමයි.

නිදසුනක් ලෙස මානව සංහතියේ සමගියට සාමූහිකත්වයට හානි කරන ආගමික ජාතිකත්ව, වාර්ගික ගෝත්‍රික ගැටුම් සංස්කෘතික පරිහානිය පෙන්වන ලක්ෂණ වේ. එය තනි තනි මිනිසාගේ වරදක් නොව ධනවාදී අර්බුදයේ හා පරිහානියේ පිළිබිඹුවකි.

නිර්ධන පන්ති සංස්කෘතිය යනු දිළින්දන්ගේ සංස්කෘතිය නොවේ. එය ගොඩනැගෙන්නේ දිළින්දන්ගේ දෘෂ්ටිය අනුවද නොවේ. එය අනාගත දියුණු සමාජය නියෝජනය කරන සමාජ දෘෂ්ටිය වන නිර්ධන පන්ති දෘෂ්ටිය මත පදනම්ව ගොඩනැගෙන සංස්කෘතික ලක්ෂණවලින් යුක්ත එකකි.

ධනපති සමාජයක් තුළ දී නිර්ධන පන්ති



සංස්කෘතිය පොදු නිර්ධන පන්ති ජනයා තුළ පවතින්නේ නැත. ඒ වෙනුවට එය පවතින්නේ නිර්ධන පන්ති විප්ලවකාරී ව්‍යාපාරය තුළ ය.



# හොංකොංහි මිනිස් කූඩු

**‘ස්ථිරවම එය ඔබගේ නවාතැන වනු ඇත.
සමහර විට එයම ඔබගේ මිනීපෙට්ටියද වනු ඇත.’**

අප සාමාන්‍යයෙන් අසා ඇත්තේ ලේන් කූඩු, මයින් කූඩු, ගිරා කූඩු හෝ කපුටු කූඩු ගැනය. නමුත් දැන් ලෝක තත්වයන් වෙනස්ය. මිනිසා දියුණුය. එහෙයින් ලෝකයේ නවතම කූඩු විශේෂයක් බිහිවී ඇත. ඒ මිනිස් කූඩුය(Cage Homes). ඒවා ප්‍රථම වරට හඳුන්වා දුන්නේ ආසියාවේ දියුණු යැයි සම්මත, ධනවාදී ආර්ථික ක්‍රමයක් සහිත හොංකොං රාජ්‍යය තුළය.

හොංකොං රාජ්‍යයට අනුව මෙම නිවාස ‘නිදන කාමර’ ලෙස හැඳින්වේ. එම එක් නිදන කාමරයක 12ක් හෝ 12කට වැඩි ගණනක් ජීවත්වේ. මෙසේ නිදන කාමර යනුවෙන් හොංකොං රජය හඳුන්වා දෙන්නේ අඩි 6ක් පළල අඩි 12ක් දිග යකඩ කූඩුය. ඒවා හොංකොං රාජ්‍යය තුළ නීත්‍යානුකූල නිවෙස්ය. ඒවායේ අයිතිකරුවන්ගෙන් හොංකොං රාජ්‍ය බදු මුදල් ගනු ලබන බැවින් ඒවා රාජ්‍ය පිළිගත් හා ප්‍රමිතිගත කුලී නිවාසයන්ය. 2019 දී හොංකොංහි 60,000කට අධික ජනතාවක් මුදල් ගෙවා සිරකූඩුවක් තෝරාගනු ලැබූ අතර එය 2022 දී 110,000ක් විය.


හොංකොං යනු ලොව අධිකම මිල සහිත නිවාස වෙළඳපොළයි. එය 2010 සිට පුරා වසර 8ක් ලොව අධිකම නිවාස මිල ඇති රටවල් ශ්‍රේණිගත කිරීමේ සිටියේ අංක එකටය. හොංකොං වර්ග සැතපුම් 1064ක ලක්ෂ 60කට අධික ජනගහනයක් ජීවත්වන දූපත් රාජ්‍යයකි. මෙම සීමිත බිම්කඩක අසාමාන්‍ය ජනගහන වර්ධනයට හේතුව වූයේ 1950 - 1951 දී සිදුවූ චීන විප්ලවයයි. සමාජවාදී චීනයට බියෙන් පලා ආ චියැංකායිෂේක්ගේ හිතවතුන්, නෑදෑයින් බුරුතු පිටින් මෙහි පදිංචි විය. එම චීන ජනතාවගේ ජනගහන වර්ධන වේගය අද අපි දකින නිවාස මිල ඉහළයාම සහ කූඩු නිවාසවලට හේතුවයි. සමහර මිනිසුන් ජීවත්වන්නේ අඩි 2ක් පළල අඩි 6ක් දිගැති වානේ කූඩුවලය.

හොංකොං රාජ්‍ය ප්‍රකාශනයන්ට අනුව මේ කර්කශ කූඩු තුළ ජීවත්වන්නේ අධික ලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ය, කාත් කවුරුත් නැති විශ්‍රාමිකයන්ය, තනිකඩ පුද්ගලයන්ය, බලාපොරොත්තු අත්හළ මිනිසුන්ය. ඔවුන්ට රාජ්‍ය සුබ සාධන පවා නොමැත. ඒ හොංකොං ‘රාජ්‍ය ප්‍රකාශනයයි’. එහෙත් හොංකොං රජය එකක් අමතක කර ඇත. ඒ ඔවුන්ද මිනිසුන් බවයි. සිය ශක්ති ප්‍රමාණයෙන් රට ගොඩනැගීමට දහදිය, කඳුලු හෙලූ දස දහස් ගණන් වූ මිනිසුන් බවයි. මේ ඒ දූපතේ කූඩුවක් නිවෙස් කරගත් මිනිසුන්ගේ කතාවයි.

අප රීළඟට එන්නේ ලක්ෂ 25ක මිනිසුන් ජීවත්වන මහල් නිවෙස්වල කතාන්දරයටයි. මේ මහල් නිවෙස්වල ඇත්තේ එක් කාමරයකි. කුස්සියකි. ඒවා මහල් නිවෙස් යනුවෙන් ඔවුහු පවසති. එහෙත් සෑම නිවෙසකම වැසිකිලිය ඇත්තේ කුස්සියේය. විවෘතවය. පවුලේ අයෙකුට වැසිකිලියට යාමට උවමනා විට කුස්සියේ කපන කොටන උයන සියලු වැඩ නතර කරයි.. පවුලේ දෙමව්පියන්ට හෝ දරුවන්ට කිසිදු පුද්ගලිකත්වයක් නොමැත. ඇඳුම් අල්මාරිය, රූපවාහිනිය, නිදන ඇඳන්, සපත්තු සෙරෙප්පු, දරුවන්ගේ පොත්පත් යන සියලු ලට්ට ලොට්ට එකම කාමරයකය. දරුවන්ගේ ඇඳන් සහ මවුපියන්ගේ ඇඳන් තිර රෙද්දකින් වෙන්කර ඇත. දරුවෝද වැඩිහිටියෝද සිය ඇඳන් කෑම මේසය වෙනුවට භාවිතා කරති. ඒවා ශ්‍රී ලංකාවේ මුඩුක්කු පැල්පත්වලට වැඩි වෙනසක් නැත. මෙසේ ජීවත්වන මිනිසුන්ගේ සංඛ්‍යාව එරට ජනගහනයෙන් තුනෙන් එකකි. එනම් ලක්ෂ 20ක ජනතාවක් මෙම මහල් නිවාසවල තනි කාමරයක් සිය නිවෙස ලෙස ගෙන ජීවිතය ගතකරති. ඒ එක් තනි කාමරය තාත්තා, අම්මා, දුවා දරුවන් සියල්ලන්ටමය. හොංකොං ඒවා හඳුන්වන්නේ මහල් නිවාස යනුවෙනි.

මෙම නිවෙස් අතර හෝ ඉහත කී යකඩ කූඩු අතර ජීවත්වන මිනිසුන් එකිනෙකා සමඟ කතාබහ කරන්නේ නැත. ඔවුන්ගේ ප්‍රධානම විනෝදාංශය රූපවාහිනියයි. කොටින්ම මේ මිනිසුන් ජීවත්වනවා යැයි කියන්නේ හුස්ම ගැනීමටය. හොංකොං දිවයින නැරඹීමට එන විදේශිකයන් නියම හොංකොං රසවිඳීමට නම් මෙවැනි කූඩුවක හෝ මහල් නිවෙසක නතර විය යුතුය. ඒ සඳහා එරට සංචාරක ව්‍යාපාර විදේශිකයන්ව දිරිගන්වති. ඔවුන් එය හඳුන්වන්නේ දරිද්‍රතාවයේ සංචාරය (Poverty Tourism) යනුවෙනි. සෑම වසර 5කටම සැරයක් එරට දේශපාලනයේ අංක එකට ඇති ඡන්ද පොරොන්දුවකි, “සෑම පවුලකටම කදිම නිවෙසක්!”.

**] උපාලි ජයසිංහ [**



කරක් ගහාපු තැනක්

# මිනිහා ගල්කන්ද...



ලංකාවේ ජාතික වනෝද්‍යානයක් වන යාල ජාතික වනෝද්‍යානය දකුණු මුහුදු තීරය ආශ්‍රිතව පිහිටා තිබෙන අතර බොහෝ දෙනෙක් ඒ කරා ගමන් කරන්නේ සතුන් නැරඹීම සඳහා ය. එහෙත් දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත ගැටුණු අපූරු ස්ථානයක් එහි කලාප අංක දෙක තුළ පිහිටා තිබෙන අතර එය මිනිහා ගල්කන්ද නම් වේ. අපූරු ස්වභාවික නිර්මාණයක් වන මෙය ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ගැන අවධානය යොමු කරන බොහෝ දෙනෙකුට ඉතා වැදගත් ස්ථානයකි. මෙය වසර ලක්ෂ පහක් වැනි ඈත අතීතයකට අයත් බව පුරාවිද්‍යාත්මකව සාක්ෂි දරයි.

මිනිහා ගල්කන්ද නැරඹීම සඳහා සංචාරකයෙකු ලෙස ඔබ පැමිණෙන්නේ නම් මුලින්ම කිරින්ද පලටුපාන හරහා ඇති මාර්ගයෙන් යාල ජාතික වනෝද්‍යානයෙන කරා පිවිස මෙය පිහිටා තිබෙන යාල වනෝද්‍යානයේ කලාප අංක දෙක තුළට ගමන් කර මහසීලෑව, පටනංගල, සහ භූතව හරහා මැණික් ගඟ අසලට ගමන් කළ යුතුයි. මැණික් ගඟ තරණය කිරීමේ තරමක දුෂ්කර ගමනකින් අනතුරුව මැණික් ගං මෝය වෙත පැමිණ තවත් ඉදිරියට ගිය විට යාල වන සීමාවෙන් මිදී මුහුදු වෙරළට ළඟා විය යුතුය. එවිට ඔබට ඉතාමත් සුන්දර වටපිටාවක් දැකගත හැකියි. එතැන් සිට තවත් කිලෝමීටර් දෙකක් පමණ දුරක් ගමන් කළ විට මිනිහා ගල්කන්ද නම් ස්ථානය දැක බලා ගත හැකියි.

මෙහි ඇති පාෂාණ ස්ථර කාලයක් තිස්සේ ලවණ මිශ්‍ර සුළඟට නිරාවරණය වී තිබුණු නිසා ඛාදනයට ලක් වී තිබෙන අතර එලෙස ඛාදනයට ලක්වූ පාෂාණ ස්ථරය මිනිසෙකුගේ රුවක් මෙන් දිස් වන නිසා මෙය මිනිහා ගල්කන්ද නමින් හඳුන්වනු ලබයි. හුණුගල් සැකැස්මේ පහළ ස්ථරය ෆොසිලීකරණය නොවුණු යමහල කැටති සහ වැලි ගල් පාදමකින් යුක්තයි. මෙහි ඉහළ ප්‍රදේශයේ මැටි සහ වැලි ස්තර අතර ෆොසිලීකරණයට ලක් වූ පසැඟිල්ලන්, ගැස්ට්‍රොප්‍රෝඩාවන්, දෙපියන් බෙල්ලන් වැනි සමුද්‍ර ජීවීන් හමු වී ඇත. 1923 දී කැණීම් කළ මෝර්ලී ඩේවිඩ් විසින් Lamellibranchi සහ Gastropoda යන ප්‍රභේදවලට අයත් අපෘෂ්ඨවංශී මුහුදු ජීවී පොසිල හඳුනාගනු ලැබූ අතර 1960 දී පෝල් දැරණියගල විසින් ස්පොන්ජි, කොරල්, එකයිනොඩර්මාටා වැනි ප්‍රභේදවලට අයත් අපෘෂ්ඨවංශික පොසිල සොයාගන්නා ලදී.

මිනිහා ගල්කන්ද භූමියෙන් හමුවුණු විවිධ ශිලා මෙවලම් නිසා ප්‍රාග් ඓතිහාසික සාධක සහිතව ලංකාවේ හමුවන පැරණිතම ස්ථානය බවට මෙය පත්ව තිබේ. එය පුරාවිද්‍යා සාක්ෂි මගින් තහවුරු කර ඇත. විජයට පෙර ලංකාව තුළ ජනයා ජීවත් වූ බවට වැදගත් සාක්ෂි දරන මිනිහා ගල්කන්ද ප්‍රාග් ඓතිහාසික මානව ස්ථානයක් බවට හඳුනාගනු ලැබුණි.

ලංකාව පුරා නොයෙකුත් ස්ථාන සොයා යන සංචාරයට කැමති ඔබටත්, අප රටේ ඇති අතීත සාධක සොයන්නන්ටත් මිනිහා ගල්කන්ද ප්‍රයෝජනවත් වනු නිසැකය.



## ඉන්දියාවට බිලිදුන් තෙල් ටැංකි නැවත පවරාගනු!




මේ වනවිට රට තුළ ඇතිවී තිබෙන තෙල් අර්බුදය නිසා ජනතාව විශාල පීඩනයකට ලක්ව ඇති අතර රටේ තෙල් ගබඩා කර තබාගත හැකි විශාල තෙල් ටැංකි සංකීර්ණයක් තිබුණත්, එම වටිනා සම්පත ආණ්ඩුව විසින් නීති විරෝධීව ඉන්දියාවට විකුණා ඇත. එම ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියාවට විකිණීමට එරෙහිව සමාජවාදී තරුණ සංගමය විසින් දියත්කළ රටේ තාරුණ්‍යය දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ පළමුවැන්න මාර්තු 04 දින කොටුව දුම්රිය ස්ථානය අසලින් ආරම්භ විය.

සමාජවාදී තරුණ සංගමයේ සහෝදර සහෝදරියන් එක්ව මෙහිදී කොටුවට පැමිණි තරුණ තරුණියන් දැනුවත් කළ අතර මෙම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, එහි ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ සහෝදරයා සහ ජාතික කමිටු සාමාජිකා නීතීඥ ශානිකා සිල්වා සහෝදරියද එක්ව සිටියහ.

## ගල්කොරි දැමීම නිසා වන අලින් හා පුරාවිද්‍යා ප්‍රදේශ අනතුරක



හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් එලල්ල ග්‍රාමසේවා වසම තුළ දේශපාලන බලය භාවිතා කරමින් ගල්කොරි දැමීම මේ වනවිට ආරම්භ කර ඇත. මෙම ගල්කොරි පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇත්තේ යෝජිත අලිකළමනාකරණ රක්ෂිතය තුළයි. එසේම මෙම භූමිය පුරාවිද්‍යා වටිනාකමකින් යුතු භූමියක්ද වේ. පසුගිය කාලයේදී වල්සපුගල ගොවීන් විසින් වන අලි කළමනාකරණ කලාපයක් වෙන් කිරීමට කළ අරගලයේ ජයග්‍රහණයක් ලෙස මෙම ප්‍රදේශය අලි කළමනාකරණ කලාපයක් ලෙස ගැසට් කරන ලදී. නමුත් මෙවැනි අධිසංවේදී පරිසර කලාපයක් තුළ ගල්කොරි පවත්වාගෙන යෑම නිසා වන අලි එම ප්‍රදේශවලින් ඉවත්වීමේ අවධානමත් මතු විය හැක. එසේම මෙම ගල් කඳු පංතියේ එක් කොටසක් ලෙස පවතින පුරාවිද්‍යා භූමියද විනාශ වීමේ අවධානමට පවත්විය හැකිය.

මෙම රක්ෂිත හා පුරාවිද්‍යා භූමිය තුළ ගල්කොරි දැමීමට අවසර ලබාදීම පිළිබඳ සොයා බැලීමට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුරංග, දීප් චන්දන, සාලිය, සුමිත් යන සහෝදරවරුන් නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී මෙම රක්ෂිතය විනාශකරමින් පාරවල් ඉදිකරමින් ගල්කොරි දැමීම ආරම්භ කර ඇති ස්ථාන කිහිපයක් දැකගැනීමට හැකි වූ අතර මෙයට බලධාරීන් නිසි පියවර ගතයුතු බව සමාජවාදී තරුණ සංගමය අවධාරණය කර සිටිහ.

## සයින්දමරුදුවල Organic Green Society කණ්ඩායමත් JVP YOUTH සමඟ



'ජීවිතය ලස්සන කරන සුන්දර රටක් හදන්න අපිත් එක්ක එකතුවෙන්න!' කියන ආරාධනය රැගෙන සයින්දමරුදුවලට ගිය JVP YOUTH එක සමඟ පසුගියදා සයින්දමරුදුවල Organic Green Society කණ්ඩායමේ ලේකම්, සභාපති ඇතුළු සමාජිකයින් පිරිසක් සුහද කතාබහකට එක්විය. එහිදී ලස්සන ජීවිතයක් වෙනුවෙන් වැඩ කරන්න JVP YOUTH එක සමඟ එකතුවෙන්න කියන ආරාධනය පිළිගෙන organic green society කණ්ඩායම සයින්දමරුදු JVP YOUTH සහෝදරත්වය සමඟ එකතුවී වෙනස් දෙයක් කරන්න සූදානම් විය. මේ අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, අම්පාර සමාජවාදී තරුණ සංගමයේ දිස්ත්‍රික් සංවිධායක චාමික සම්පත් සහෝදරයා ඇතුළු තරුණ තරුණියන් පිරිසක් සහභාගි විය.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.